

# රනිල්

දේශප්‍රිය නානායක්කාර



| | |
|---|---|
| පරි. අංක | 6738 |
| වර්ග අංකය | 923 |
| දිනය | |

# රනිල්

දේශප්‍රිය නානායක්කාර

9 789554 243811

# yරනිල්

© දේශප්‍රිය නානායක්කාර

ISBN - 978-955-42438-1-1

පළමු මුද්‍රණය - 2019 මාර්තු

බුද්ධිමය දේපළ අයිතිවාසිකම් අනුව කතෘ හිමිකම් සහ ආර්ථික අයිතිවාසිකම්, සදචාරාත්මක අයිතිවාසිකම් යන ප්‍රකාශන හිමිකම් සියල්ල මෙම රචනයට අදල නොවේ.

**පිටකවරය**
සංජය ඈපා සෙනෙවිරත්න

**මුද්‍රණ සැකසුම**
**epa** Design Studio | 0773 47 1111

**ප්‍රකාශනය**

2019 මාර්තු 22

# පූර්විකාව

සැබෑ දේශප්‍රේමීන්ගේ දේශානුරාගී අරගලය විය යුත්තේ ආණ්ඩු වෙනස් කිරීම පමණක් නොව මහා ජනයාගේ දේශපාලන සාක්ෂරතාවය -Political literacy- වැඩි දියුණු කිරීමටද කටයුතු කිරීමයි. මිනිසාගේ තීරණාත්මක නුගත්කම දේශපාලන නුගත්කම බව -political illiterate- මානව සංහතියේම අවධානයට ලක් වී ඇත.

දේශපාලන නුගත්කම හේතුවෙන් දේශපාලනය නැමැති සුවිශාල ආලෝකයෙන් ශ්‍රී ලාංකික ජන සමාජයට අත්පත් කරගත හැකි ආර්ථික, අධ්‍යාපනික ප්‍රධාන, පොදු දියුණුව අඳුරු විය හැකිය. එම හේතුව අනුව සියලු බලවේගවල ඒකායන ප්‍රයත්නය විය යුත්තේ දේශපාලන නුගත්කම අහෝසි කිරීමට දායකවීමයි. මක්නිසාද යත් ලොව පවතිනා තෙක් දේශපාලන ක්‍රියාවලිය පිරිසිදුව නොනැවතී නොදිලේ නම්, යම් හෙයකින් මානව සංහතිය පමණක් නොව සමස්ත ජෛව සමාජයම අඳුරු වනු ඇත.

**දේශප්‍රිය නානායක්කාර**
2019.13.10
globalhumanfamily@gmail.com

රනිල්

ඉතා ඈත භූවිද්‍යා සමයේ පළමු මහා අයිස්යාය දකුණට විතැන් වූ යුගයේදී හෝමෝනොයිඩ්[01] *(hominoid'[hom)uh)noid])* ජීවියා දෙපයින් ඇවිදමින් සහ සතෙකු මෙන් සටන් සඳහා භාවිතා කළ මුඛය භාෂණය ප්‍රගුණ කිරීම සඳහා යොදා ගැනීමට හුරු වී ඇත. අයිස් යුග චක්‍රය ඇති වූ කාලයේදී වඳ වී යාම් අධික වූ නමුත් හොමොසේපියන්ස්[02] *(Homo sapiens)* නැගී ආවේ උක්ත අයිස් යුගය ජය ගත්තෙකු ලෙසය. මිනිසාගේ මොළය ක්‍රමයෙන් දියුණු වුයේ කොඳු ඇට පෙළ නම් වූ අක්ෂීය ඇටසැකිල්ලේය. පුළුල්ව ගිය මොළ කුහරය නිසා විශාල වූ මොළය මඟින් මිනිසාට සුපරි බලයක් ලැබිණි. ජීවන සටන සඳහා යෝග්‍යවන ආකාරයෙන් පරිණාමය වී ඇති ඉතාම බලවත් වූ තනි ජීව විද්‍යාත්මක අනුවර්තනය වන්නේ මිනිසාගේ මස්තිෂ්කයයි. එතැන් පටන් පරමාණු ඛණ්ඩනය කිරීමටත් සඳ මත ඇවිදීමටත් හැකියාව දෙන මොළයේ සංවර්ධනය අද්විතීයය. නූතන මිනිසා දැනුමේ අග්‍ර ස්ථානයටම පැමිණ ඇති හෙයින් ශ්‍රී ලාංකිකයන් තම දැනුම නිවැරදිව භාවිතා කොට රටේ අනාගතය වෙනුවෙන් නිවැරදි අවබෝධය ඇති කර ගනු ඇතැයි මේ කෘතියේ අපේක්ෂාවයි. මක් නිසාද යත් බුද්ධිය යනු ස්වභාවික වරණයේ අවසන් ප්‍රතිපලය වන හෙයිණි.

"Good leadership does not mean being aggressive and violent. Good leadership is to be mentally resilient, the ability to stand up to repeated challenges, not be shaken, or influenced or pressurized but flexible when necessary. To have a vision in line with the people's and be capable of achieving it"

- Ranil Wickremesinghe -

*Prime Minister of Sri Lanka*



# බලගතු ශ්‍රී ලංකාවකට දැනුමෙන් බලවත් ගෝලීයව පිළිගත් ජාතික නායකයෙක්

දේශපාලන ක්‍රියාවලිය, වාණිජමය ව්‍යාපාරයක් නොව මානව දායාව පෙරදැරි කොට ගෙන සිදු කෙරෙන උසස් සමාජ සේවාවක් බව දේශපාලන දාර්ශනිකයන්ගේ පිළිගැනීමයි. දේශපාලනය සහ අධ්‍යාපනය අතර සම්බන්ධතාවයන් එකම කාසියේ දෙපැත්ත ලෙස දුටු දේශපාලන දාර්ශනිකයෝ පිරිසිදු දේශපාලන න්‍යායන් පිරිසිදු ලෙසම ක්‍රියාවට නැංවීම රටක සෞභාග්‍යය කෙරෙහි සෘජුවම බලපානු ඇතැයි දැඩිව පිළිගෙන ඇත.

අල්ලස් ගැනීම, දූෂණ පණ ගැන්වීම, විවිධ මාදිලියේ වංචා හා මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හා දේශපාලනික පළිගැනීම් ආදිය සම්පූර්ණයෙන් හෙළා දුටු දේශපාලන දාර්ශනිකයෝ රටක ප්‍රතිපත්ති සකස් කරන්නන් හා ඒවා ක්‍රියාත්මක කරවන පුද්ගලයන් පවිත්‍ර පුද්ගලයින්ම විය යුතුයැ යි අවධාරණය කර ඇත. පෞද්ගලික ධනය, පෞද්ගලික දේපොළ පාලකයින්ට අකැප විය යුතු යැයි දාර්ශනිකයන් තවදුරටත් අදහස් දක්වා ඇත්තේ මක් නිසාද යත්, පෞද්ගලික අවශ්‍යතාවයන්ට අවකාශ ඇති තැන ආත්මාර්ථය නැගී සිටින හෙයිණි. එහෙත් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් අනෙක් පුරවැසියන්ගේ මෙන් ආරක්ෂා කළ යුතු යැයි දේශපාලන දාර්ශනිකයෝ පිළිගෙන ඇත.

සොක්‍රටීස්[03] පඬිවරයා සාධාරණත්වය නියම උගත්කමේ ප්‍රධාන ලක්ෂණයක් බව සනාථ කරන්නට තැත්කර ඇත්තේ,

> 'වෘත්තීය දැනුමෙන් සැදුම්ලත් සාධාරණ මිනිසා නැණවතෙකි, නැණවතාම ශ්‍රේෂ්ඨයෙකි. නැණවතාම පාලන බලතල දැරීමට සුදුසුය. සාධාරණත්වය නියම දියුණුවට ඇති එකම ක්‍රමය වන අතර සාධාරණත්වය හා අත්වැල් බැඳගෙන යන ප්‍රතිඵලද අතිශයින්ම උසස්ය' යනුවෙනි.' *(The Republic : Lec.p.80)*



*Socrates*

දේශපාලන නැණවතා යනු ප්‍රජාතන්ත්‍රවාදය ගරුකොට ක්‍රියාත්මක වන නායකයෙකි. ප්‍රජාතන්ත්‍රවාදය යනු 'ප්‍රජාව මගින් ආණ්ඩු කිරීමයි' එසේ නැතහොත්, මහජනයා උදෙසා වූ ජීවන ක්‍රමය මහජනයා විසින්ම පවත්වන ආණ්ඩුවක් බවයි. මෙය වනාහි පුරාතන ග්‍රීකයන්ගෙන් ගෝලීය මානව සමාජයට උරුම වූ දේශපාලන ක්‍රමයකි. පුරාතන ග්‍රීකයෝ ඒ ඒ නගර වටා පිහිටුවා ගත් පෞර රාජ්‍ය වල ජීවත් වුවෝය. උක්ත කුඩා රාජ්‍යවල විසූ සියලු ජනයා එක් තැනකට රැස්ව තම රාජ්‍යයෙහි පාලන කටයුතු ගැන ගැන සාකච්ඡා කළෝය. සැබවින්ම ග්‍රීක සමාජයේ ආණ්ඩුකරණය යනු සියලු ජනයාගේ කැමැත්ත අනුව පාලනය වීමය. කුඩා පුරයක විසූ ජනයාට නිශ්චිත ස්ථානයක රැස්වී ආණ්ඩු කරණය පිළිබඳ සියලු කරුණු සාකච්ඡා කිරීමට හැකි වුවත් මහා රාජ්‍යයක ජීවත් වන සියලු ජනයාට එක් ස්ථානයකට රැස්වී කටයුතු කළ නොහැකිය. එසේ හෙයින් මහජනයා විසින්ම තෝරාගත් නියෝජිතයන් ලවා රට ආණ්ඩුකර වීමේ ක්‍රමය ආරම්භ වූ බව ඔබ දන්නා කාරණයකි.

# ප්‍රජාතන්ත්‍රීය ජීවන ක්‍රමය

ප්‍රජාතාන්ත්‍රිය ජීවන ක්‍රමය යනු කුමක්ද? යන ප්‍රශ්නයට පිළිතුර පහත පරිදිය.

'රට වැසියන් වශයෙන් තමන්ට හිමි අයිතිවාසිකම් අනුව සෑම මිනිසෙක්ම නිදහස සහ සමානත්වය ඇතිව උත්පත්තිය ලබයි.මෙකී අයිතිවාසිකම් වනුයේ නිදහස, නිදහස සහ දේපොළ පිළිබඳ අයිතිය, සුරක්ෂිත භාවය, සමානත්වය හා පීඩනයට එරෙහිව නැගී සිටීමත්ය' යනුවෙන් 1789 දී ප්‍රංශ යේ ජාතික මන්ත්‍රී මණ්ඩල ය ප්‍රකාශ කරන ලදී. (Declaration of the rights of man and of the citizen) උක්ත ඉතා වැදගත් ප්‍රකාශය කරන ලද්දේ අත්තනෝමතික රාජබලයටත්, දූෂිත රදළ බලයටත් විරුද්ධව නැගී සිටි ප්‍රංශ ජනයා විසිනි. එතැන් පටන් ප්‍රජාතාන්ත්‍රිය වූ සෑම රටක්ම සියලු මිනිසුන්ගේ නිදහස සහ සමානත්වය නිරවශේෂයෙන්ම පිළිගෙන ඇත. එසේ හෙයින් ප්‍රජාතාන්ත්‍රිය ජීවන ක්‍රමය ගොඩනගා තිබෙන්නේ යම් රටක වෙසෙන සෑම මිනිසෙක්ම අයිතිවාසිකම් අතින් එක හා සමානය යන විශ්වාසී ස්ථිර පිළිගැනීම මතය.

ඇමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුවේ තෝමස් ජෙෆර්සන් Thoms Jefferson ප්‍රධාන ආදී කතෘවරු 1776 දී බ්‍රිතාන්‍යයෙන් වෙන්ව, නිදහස් රාජ්‍යයක් පිහිටුවා ලූ අවස්ථාවේ හී මිනිසාගේ නිදහස හා සමානත්වය අර්ථ දක්වා ඇත්තේ 'සියලු මනුෂ්‍යයෝ එක සමාන ලෙස මවනු ලබත්, මැවුම් කරු විසින් ඔවුන් මවනු ලබන්නේ අන් සන්තක කළ නොහැකි සාධාරණ අයිතිකම් සමූහයක් සහිතව සහ ජීවිතය, නිදහස හා නොනවතින සතුට භුක්ති විඳීමට ඇති අයිතිය ස්ථිර ලෙස තහවුරු කිරීම' වශයෙනි. (all men are created equal, that they are endowed by their Creator with certain unalienable Rights,that among these are life, liberty and the pursuit of happiness) ඒ අනුව ආණ්ඩු පිහිටුවනු ලබන්නේ උක්ත සාධාරණ අයිතිකම් තහවුරුකොට ජීවිතයේ නිදහස සහ සතුට ප්‍රවර්ධනය කිරීම වෙනුවෙනි. ආණ්ඩු සතු සියලු බලතල ඊට හිමි වන්නේ පාලනය වන ජනතාවගේ කැමැත්ත අනුවය. යම් ආණ්ඩුවක් උක්ත පරමාර්ථ පමුණුවාලීමට බාධා කරයි නම් ඒ ආණ්ඩුව වෙනස් කිරීම හෝ අවලංගු කිරීම මහජනයා සතු අයිතියකි.

ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමය ගරු කොට ගන්නා ජන සමාජයක මිනිසාගේ සමානත්වය හා නිදහස කොතරම් උසස් තන්හි ලා සලකනු ලැබේදැයි උක්ත ප්‍රකාශයට අනුව ඉතා තීව්‍රව පැහැදිළි වේ. ශාරීරික වශයෙන් හෝ මානසික වශයෙන් හෝ කිසිම මිනිසුන් දෙදෙනෙකු අතර සමානතාවයක් දක්නට නැත. අපේ සමානකම් හා වත් පොහොසත් කම් අතින්ද අපි ඔවුනොවුන්ට බෙහෙවින් වෙනස් වෙමු. ඒ නමුත් රටවැසියන් වශයෙන් අප සතු අයිතිකම් අතින් අපි ඔවුනොවුන්ට හාත්පසින්ම සමානය. දුප්පත් රට වැසියෙකු සතු අයිතිකම්, පොහොසත් රට වැසියෙකු සතු අයිතිවාසිකම් වලට සමානය. එමෙන්ම යම් පුද්ගලයෙකු බලවත් හෝ පොහොසත් වූ පමණින් ඔහුට අනෙක් අයට වඩා අයිතිකම් කිසිවක්ම නොමැත. පොදු ජන සමාජයේ සාමාජිකයන් වශයෙන් අප හැම දෙනා සතු අයිතිකම් ස්ථිර වශයෙන්ම එක සාමානය. සැබවින්ම ප්‍රජාතාන්ත්‍රීය ජීවන චාරිත්‍ර අභ්‍යාස වන ජන සමාජයක සෑම රටවැසියෙක්ගේම වටිනාකම් එක සමානය. එහෙයින් කිසිම රට වැසියෙකු රාජ්‍යයට අනවශ්‍ය නොවටිනා පුද්ගලයෙකු හැටියට සැලකීමට ඉඩක් නොමැත. එපරිද්දෙන්ම කිසිම රටවැසියෙකු සෙස්සන්ට වඩා බොහෝ වටිනා අත්‍යවශ්‍ය පුද්ගලයෙකු හැටියට සැලකීමට ද පුළුවන් කමක් නැත.

ප්‍රජාතාන්ත්‍රීය වූ සමාජයක වෙසෙන සියලු රටවාසීන් උත්පත්තියෙන් එක සමාන තන්හි ලා සලකන බැවින් සෑම රට වැසියාටම ස්වකීය උගත්කම, සමත්කම සහ පෞද්ගලිකත්වය හැකිතාක් දියුණු කර ගැනීම පිණිස සම්පූර්ණ නිදහස තිබිය යුතුය. වෙනත් කිසිවෙකුගේ බලපෑමක් නොමැතිව තමා කැමති ජීවනෝපායක යෙදීමට රට වාසීන්ට සම්පූර්ණ නිදහස සහ ආරක්ෂාව මෙන්ම තම හෘදය සාක්ෂ්‍යය ට එකඟව කල්පනා කිරීමට ප්‍රජාතාන්ත්‍රීය ජීවන චාරිත්‍ර අභ්‍යාස වන ජන සමාජයක සෑම රට වැසියාටම අයිතිය තිබීම එහි ඇති විශේෂ ලක්ෂණයකි. එම නිසාම කැමති ආගමක් ඇදහීමටත්, කැමති දේශපාලන මතයක් පිළිගැනීමටත් සම්පූර්ණ නිදහස ඇත. විවිධ අදහස් හා ගති ගුණවලින් යුත් ජනතාවක් යම් රටක වාසය කරන විට, ඔවුන් අතර අනවරතයෙන් මතභේද හා සට්ටන ඇතිවනු ඇතැයි කෙනෙකුට සිත් විය හැකිය.

ඉන්දියාව සිසාරා භයානක ලේ වැගිරීම් සිදුවී විශාල ඉන්දියානු රාජ්‍යය කොටස් දෙකකට කැඩී ගියේ එහි පැවති බිහිසුණු ආගම් හා ජාතිභේද හේතුවෙනි. මේ පරිද්දෙන්ම පැරණි යුරෝපයේ නොයෙකුත් බොහෝ රටවල්වලද ආගම් මුල් කර ගෙන නොයෙකුත් යුද්ධ කෝලාහල සිදුවූ බව

ඉතිහාසය විස්තරාත්මකව පැහැදිලිකර ඇත. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය දියුණු වූ රටවල මෙබඳු අරගල වළක්වා ගැනිම පිණිස රටවාසීහු පුරුදු වී ඇති අතර උක්ත පුරුදු තමන්ගේ සමාජීය අවශ්‍යතා වෙනුවෙන් නොපැකිළිව අභ්‍යාස කිරිමට මහජනයා පෙළඹීමට දේශපාලන පක්ෂ වල දෘෂ්ටිවාදයන් හේතු වී ඇති බව පැහැදිලිය. සැබවින්ම එසේ නොවුවහොත් ප්‍රජාතාන්ත්‍රිය වූ රාජ්‍යයන්, බලයෙන් පිරිහී දුබලව විනාශයට පත්විමට ඇති අවස්ථා බහුලය.

විරුද්ධ වූ අදහස් ඉවසීම ප්‍රජාතාන්ත්‍රිය ජීවන ක්‍රමයෙහි අත්‍යවශ්‍ය අංගයකි. විවිධ ආගමික හා දේශපාලන අදහස්, උදහස් උසුලන ජනයා ලෝකයේ සෑම රටවලම ජීවත්වෙති. මොවුන් අතර පැන නගින සෑම මතභේදයකදීම ගැටුම් සහ කෝලාහල කර ගැනීමට ක්‍රියා කළහොත්, රාජ්‍යයත්, සමාජයත් විනාශ වනු ඇති බව පොදු මහා සමාජයටම අවබෝධ වන බව ඉතා පැහැදිළිය. එබඳු තන්හිදී තම අදහසට විරුද්ධ වූ මත ඉවසීමට ප්‍රජාතාන්ත්‍රිය ජනතාවෝ පුරුදුව පුහුණුව මැදිහත්ව ක්‍රියා කරති. ඔබේ ආගමික හෝ දේශපාලන මතය තරයේ වැළද- ගැනිමට ඔබට නිදහස තිබේ. එමෙන්ම අනික් පුද්ගලයාටද, ඔබේ විශ්වාසයන්ට විරුද්ධ වූ අනෙක් ආගමක් ඇදහීමට හෝ ඔබට රුචි නොවූ සමාජ, දේශපාලන දෘෂ්ටිවාදයක් හෝ වැළඳගැනිමට හෝ සම්පූර්ණ නිදහස ඇත. කුමක් හෙයින්ද යත්, ඔහුද ඔබ මෙන්ම ඔබ ජීවත් වන සමාජයේ සමාන කොටස්කාරයෙකු වන හෙයිනි. ඔබ, ඔබේ මතයේ තරයේ එල්බගෙන සිටින අතරම අනික් තැනැත්තාගේ මතයටද ගරු කළ යුතුය. ඔහුද ඔබේ මතය පිළිගත යුතුයැයි බල කිරීම පිණිස ඔබට අයිතියක් නැත. විරුද්ධ වූ අදහස් ඉවසීම යනුවෙන් අදහස් කරණුයේ මෙයයි. ප්‍රජාතාන්ත්‍රිය ජීවන ක්‍රමයකට පුරුදුවන සෑම රට වැසියෙකුම උක්ත පුරුද්ද ක්‍රමිකව එහෙත් ස්ථිරව වැඩි දියුණු කර ගැනීම ඕනෑම රටක දයාලු මානවතාවාදයක් බිහිවීමට ස්ථිරවම හේතුවනු ඇත. රටවාසීන් අතර ගැටුම්, අරගල, කෝලාහල දුරලා එක්සත් ජාතියක් වීම පිණිස දයාලු මානවතාවාදය ඕනෑම ජාතියකට ඉතා අත්‍යාවශ්‍යය.

විරුද්ධවූ මත ඉවසීමත්, විරුද්ධ අදහස් මැඩලීමට තැත් නොකොට එබඳු අදහස් වලට ඉඩදීමත්, ප්‍රජාතන්ත්‍රවාදයේ පැවත්ම පිණිස අතිශයින් අවශ්‍යය වූ ගුණාංග දෙකකි. පැරණි මතවල තරයේ එල්බගත් ගතානුගතිකවූ ඇතැම්හු විරුද්ධ අදහස් ඉවසීමට තරම් දියුණු වී නැත. ඕනෑම සාමජයක මෙවැනි නොදියුණු පුද්ගලයන් සුළු පිරිසක් ඇතත් බොහෝ විට උක්ත සුළු පිරිස ජන සමාජයට විශාල බලපෑමක් ඇති කරන ඇති ලබයි. එමනිසා උක්ත

තත්ත්වය රටක සාමයට හා සමගියට සහ ආර්ථික, අධ්‍යාපනික හා පොදුවේ ජන සමාජයේ දියුණුවට බලවත් බාධාවකි. එක සමානවූ ගතිගුණ හා අදහස් උදහස් ඇති කිසිම ජනතාවක් ලොව කිසිම රටක නැත. විරුද්ධ අදහස් හා අනෙකාගේ කැමැත්ත ඉවසීමට පුරුදු වූ ජනයා උසස් මානව චාරිත්‍ර වලින් පොහොසත් අතර සමගිය හා සාමය නිරන්තරයෙන් සුරක්ෂිත වනුයේ එවැනි ජන සමාජවල බව අමතක නොකළ යුතු ඉතා වැදගත් කරුණකි.

විවිධ අදහස්, උදහස් ඇති ජනයාගෙන් ගහන වූ කෙබඳු රටක වුව ද ඔවුනොවුන් අතර මතභේද හා ප්‍රශ්න පැන නැඟිම ස්වභාවික සිද්ධියකි. එහෙත් උක්ත මතභේද නිරවුල් කරගැනීමත්, නොයෙක් ප්‍රශ්න හා ගැටලු විසඳා ගැනීමත් මානව හැඟිමේන් සපිරි බුද්ධිමත් ජනයාට දුෂ්කර නොවේ. නිදහස් ලෙස සාකච්ඡා කොට සමගි සම්මුතියකට පැමිණීම ඊට ඇති ඉතාමත් හොඳම සහ පහසුම ක්‍රමයයි. සමගියෙන්, සාකච්ඡාවෙන් එකඟතාවයට පැමිණෙන තීරණය බලහත්කාරයෙන් ගන්නා තීරණයක් මෙන් නොයෙක් පක්ෂ සහ සමිති සමාගම්වල නිරන්තර ද්වේශයට ලක් වන්නේද නැත. සාකච්ඡාවෙන් සම්මුතියෙන් තීරණය වන එකඟතා යනු දේශපාලන පක්ෂ සහ පොදුවේ සියලු ස්වේච්ඡා සමිති සහ සමාගම් වල එකඟතාවය ඇතිව සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි තීරණයකි. සාකච්ඡාවෙන් සම්මුතියෙන් ඇතිවන වටිනාකම් වනුයේ කිසිම පක්ෂයකට හෝ සමිතියකට, සමාගමකට ජයක් හෝ පරාජයක් නොමැතිව හැම පක්ෂයකම ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු සිදුවීමයි. උක්ත තත්ත්වය ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමයේ අසහාය අංගයක් කොට සලකන්නේ එහෙයිනි.

ඕනෑම ජනතාවක් අතර ප්‍රජාතන්ත්‍රවාදය මුල්බැස ගැනීමට නම් සිය කැමැත්තෙන් ම සමිති සමාගම් පැවත්වීමේ පුරුද්දක් ඇති විය යුතුය. ජනයා සිය කැමැත්තෙන් ම පිහිටුවා ගන්නාවූ මෙබඳු සමිති සමාගම් ප්‍රජාතාන්ත්‍රීය ජීවිතයේ අවශ්‍යතම අංගයකි. පොදු ජනයා සිය කැමැත්තෙන් මෙබඳු සමිති සමාගම්වලට සම්බන්ධවීම ප්‍රජාතාන්ත්‍රීය ජනතාවකට අවශ්‍යය වන්නේ පහත දැක්වෙන උසස් මානව චාරිත්‍ර තව තවත් ප්‍රචලිත වී ජන සමාජය ගුණාත්මකව මානවිකරණයට ලක් වන හෙයිනි.

01) පළමුකොට පොදු පරමාර්ථයෙන් යුතුව එක්සත්ව ක්‍රියා කිරීමේ පුරුද්දක් සමිති සමාගම් වලට සම්බන්ධවීමෙන් රටවාසීන්ට ලැබෙන බැවිනි.


02) දෙවනුව නිදහස් ලෙස රැස්වීම, සාකච්ඡා කිරීම හා සමගි සම්මුතියට එළඹීම, යන වටිනා ගුණාංග මෙකී සමිති සමාගම් මාර්ගයෙන් ජනයාට අත්වන හෙයිනි.

03) තෙවනුව රටවාසීන්ගේ පොදු අභිවෘද්ධිය හා ආරක්ෂාව උදෙසා පවත්වන මහා සංගමයක් වූ රාජ්‍යයෙහි කටයුතු ගැන විශේෂ සැලකිල්ලක් හා උනන්දුවක් දැක්වීමට රටවාසීන් පෙළෙඹෙන බැවිනි.

'මහජනයා විසින් මහජනයා උදෙසා පවත්වන මහජන ආණ්ඩුවක්' සාර්ථක ලෙස පවත්වා ගත හැක්කේ රටවාසී පොදු ජනයා රාජ්‍යය නම් පොදු සංගමය පිළිබඳව නිරායාසයෙන් ම අවධානයක් දක්වන්නට වූ විටය. ආණ්ඩුවේ කටයුතු පිළිබඳවද රටවාසීන් උදාසීනත්වය දක්වන බොහෝ රටවල ඒකාධිපතීහු පහළවී ඇත. ඒකාධිපතියන් යටතේ හැම රටකම මහජන නිදහස හෝ මහජන අයිතිකම් නැති භංග වී ඇත. රටවාසීහු මානසිකව ද කායිකාව ද වහල් බන්ධනයට හසුවූහ. ගෝලය සිසාරා උක්ත තත්ත්වයට උදාහරණ ඇත. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදය යනු මානව සංහතියේ පැවැත්ම සඳහා වූ වැදගත්ම සමාජීය අත්තිවාරමකි. ප්‍රජාතන්ත්‍රවාදය අත්තිවාරම තව තවත් ශක්තිමත් වනුයේ ඕනෑම ජන සමාජයක ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමය සාර්ථකව අභ්‍යාස වීමෙන් බව ජනයා මෙහොතකට හෝ අමතක නොකළ යුතුය. අද්‍යතන ශ්‍රී ලාංකික අධ්‍යාපන ක්‍රමයේ පුරවැසි අධ්‍යාපනය (citizenship education) නමින් විෂයක් ඇති බැවින් යෞවන හා තරුණ පරපුර උක්ත ප්‍රජාතාන්ත්‍රික ජීවන ක්‍රමය අනුව ගොඩනැගෙනු ඇත.

The Philosophy of the school room in one generation will be the
philosophy of government in the next.

*-Abrahan Lincon-*



*Abrahan Lincon*

ආරනිල්

# රාජ්‍යය නම් වූ සමාජය

රාජ්‍යය නම්, පොදුජන ආරක්ෂාව හා අභිවෘද්ධිය උදෙසා පිහිටුවා ගත් මහා සංගමයක් හෙවත් පොදු සමාජයක් වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී රටවල පිළිගැනිමට ලක්වී ඇත. මහාජන මතය අනුව ක්‍රියාත්මක ආණ්ඩුවක් නම් එය ජනයා සතු උපකරණයක් විය යුතුමය. හැකිතාක් දුරට පොදු යහපත සලස්වාලිම සඳහා ආණ්ඩුව නම් වූ උක්ත උපකරණය මෙහෙයවීම පිණිස මහජනයාට අයිතියක් තිබිය යුතුය. වෙනත් අකාරයක විග්‍රහයක් වනුයේ ආණ්ඩුව මහා ජනයාගේ යහපත් පැවත්ම සඳහා ක්‍රියාත්මක විය යුතු උපකරණයක් වනු මිස මහජනයා ආණ්ඩුව උදෙසා බැලමෙහෙවර කිරීමට ජීවත්වන පිරිසක් නොවේ යනුවෙනි. පුද්ගලයා සතු නිදහසට රාජ්‍යයෙන් යම් බාධා සිදුවේ නම් උක්ත රාජ්‍යය ප්‍රජාතාන්ත්‍රිය රාජ්‍යයක් යැයි කිසිසෙත් පිළි-ගැනිමට නොහැකිය. ආණ්ඩුව වනාහි පොදු ජන සමාජයේ යහපත පෙරදැරිව පිහිටුවාගෙන ක්‍රියාත්මක දේශපාලන උපකරණයක් නම් එය රටවාසීන්ට අභිමත පරිදි හැඩ ගස්වා ගැනීමට ද නිදහස තිබිය යුතුය. ජන සමාජයේ වාසය කරන සියලු මනුෂ්‍යයන් අතර සාමය හා මනා සම්බන්ධය පැවැත්වීම පිණිස නීති, අණ පනත්, සෑම රාජ්‍යයකම පනවා ඇත. උක්ත නෛතික උපකරණ, බොහෝ විට ඒ ඒ මනුෂ්‍යයන් අතර චිරාගතව පැවත එන සමාජීය චාරිත්‍ර ධර්ම වේ. ආණ්ඩුව වනාහි පොදු ජන සමාජයේ යහපත පෙරදැරිව පිහිටුවාගෙන ක්‍රියාත්මක දේශපාලන උපකරණයක් වන අතර රාජ්‍යයෙහි යහපත සහ දියුණුව වෙනුවෙන් නෛතික උපකරණ රාශියක් ක්‍රියාත්මක විය යුතුය. සෑම රාජ්‍යයකම ආණ්ඩුවක් තිබිය යුතු අතර ආණ්ඩුව ක්‍රියාවෙහි යෙදීම පිණිස ආණ්ඩුව ප්‍රධාන නෛතික උපකරණ 03 කින් සමන්විතය.

එනම්:-

01) ව්‍යවස්ථා සම්පාදනය

02) විධානය

03) අධිකරණය

යනුවෙනි.

ආණ්ඩුවකට අයත් විය යුතු උක්ත ප්‍රධාන උපකරණ 3 එකිනෙකින් ඈත්ව හෝ එකිනෙකට සම්බන්ධව හෝ නැත. අධිකරණය, ව්‍යවස්ථාදායකය හා විධායක යන ද්වයෙන් වෙන් කොට ස්වාධීනව තබා ගැනීම පිණිස, ප්‍රජාතාන්ත්‍රිය වූ බොහෝ රටවල් උත්සාහ කර ඇති බව දර්ශනය වේ. අධිකරණය පුද්ගල

විශේෂයක් හෝ දේශපාලන සබඳතා නොමැති සාධාරණ ලෙසත්, නිර්භය ලෙසත්, යුක්තිය ඉටුකරලීමට නම්, එය විධායක පක්ෂයේ පාලනයෙන් මුදාලිම ප්‍රජාතාන්ත්‍රිය රටක ප්‍රධාන ලක්ෂණයකි. ප්‍රජාතන්ත්‍ර වාදය අනුව 'රාජ්‍යය' යනු විශාලතම සමාජයක් බව පැහැදිළි විය යුතුය. ජන සමාජය හා රාජ්‍යය අතර ඇති වෙනස වනුයේ, ජන සමාජය යනු සමස්ත මානව සංහතියම ඇතුළත් වන වඩා පුළුල් විශාල වූ සන්නතියකි. රාජ්‍යය මගින් සිදුවනුයේ මනුෂ්‍යය සමාජයේ පැවතුම් හා අන්‍යෝන්‍ය සම්බන්ධකම් මනා අන්දමින් පාලනය කිරීමයි. මානව සමාජයේ නීතිය, සාමය, හා සුරක්ෂිතභාවය තහවුරු කොට පවත්වාගෙන යෑම ඉන් ප්‍රධානතම කාරණයකි. ඒ සමග තම ජන සමාජයේ මානසික වූ ද, ශාරීරික වූ ද, දියුණුව සඳහා අවශ්‍යය වන්නා වූ සෑම මෙහෙයක්ම රාජ්‍යය විසින් සම්පූර්ණ කළ යුතුය. ජන සමාජය සුරැකි ලෙස එක්සත් කොට තබා පොදු අභිවර්ධනයට හා යහපතට ක්‍රියා කිරිම රාජ්‍යය නම් වූ සමාජයේ වගකීම බව මින් අදහස් වේ.

We are all imperfect, We can not expect perfect government.

*-William Howard Taft- 27th president of the United States*

එහෙත් ඒකාධිපති පාලනය ක්‍රියාත්මක වන රටවල රාජ්‍යය වනාහි ජන සමාජයට වඩා ප්‍රබලවූ ද උසස් වූ ද සර්වග්‍රාහී බල මණ්ඩලයකි. සැබවින්ම ඒකාධිපති පාලනයක් යටතේ රාජ්‍යය පුද්ගලයාගේ පැවත්ම සඳහා ක්‍රියාත්මක වන උපකරණයක් නොවේ. එබඳු රටවල පුද්ගලයා රාජ්‍යය සඳහා ජිවත් වන්නෙකි. ඒ අනුව පුද්ගලයාගේ නිදහස රාජ්‍යය වෙනුවෙන් කැපකළ යුතුය. ඔහුගේ ඇදහිම් කල්පනා කිරීම්, හැසිරීම් යන හැම දෙයක්ම රාජ්‍යයට අභිමත පරිද්දෙන් සිදුවිය යුතුය. රාජ්‍යයේ බලය අන් සියලු දේ අභිභවා ක්‍රියාත්මකය. එහි ගුණ දොස් දැක්වීමට හෝ අඩුපාඩු පෙන්වාලිමට හෝ රටවාසීන්ට අයිතියක් නොමැත. උක්ත ආකාරයේ රටක බොහෝවිට සිදුවනුයේ යම්කිසි බලසම්පන්න පක්ෂයක හෝ පුද්ගලයන් අතලොස්සකගේ අත්තනෝමතික බලයට මුළු රටම අවනත වීමය. මේ වනාහි ප්‍රජාතන්ත්‍රවාදයට හාත්පසින්ම වෙනස් වූ ඒකාධිපති වාදයයි.

රනිල්

# මිනිසා විසින් පිහිටුවාගත් සමාජ ගිවිසුම

තෝමස් හොබ්ස්, ජෝන් ලොක්, ජීන් ජැක් රූසෝ යන ප්‍රධාන දේශපාලන දාර්ශනිකයන් රාජ්‍යය යනු සමාජයේ ආරක්ෂාව හා පැවැත්ම මුල් කරගෙන මිනිසා විසින් පිහිටුවා ගත් සමාජ ගිවිසුමක් මත ක්‍රියාත්මක වන පාලන ආකෘතියක් බව ප්‍රකාශ කර ඇත. සෑම රට වැසියෙක්ම තම තමාට අභිමත පරිද්දෙන් ජීවත් වන්නට ක්‍රියා කළහොත් නීතියක් හෝ සාමයක් පමණක් නොව යුක්තිය හා සධාරණය පවා ඉටු නොවනු ඇත. එහෙයින් නීතිය හා සාමය ඇතිකොට සමාජයේ ආරක්ෂාව සහ යහපත සැලසීම පිණිස පොදු ජනතාවගේ කැමැත්ත මත පිහිටුවා ගන්නා ලද රාජ්‍යය නම් වූ දේශපාලන උපකරණය, පාලනය වන්නා වූ ජනයා විසින්ම බල සම්පන්න බවට පත් කරන ලද ක්‍රමයකි.

ප්‍රජාතන්ත්‍රවාදය යම් රටක සාර්ථක ලෙස අභ්‍යාස වීමට නම් ජනයා ප්‍රජාතාන්ත්‍රිය ජීවිතයට හැඩ ගැසිය යුතුය. ඉහත විස්තර කර ඇති ප්‍රජාතාන්ත්‍රිය මානුෂිය ගුණාංග වැඩි දියුණු වූ තරමට ප්‍රජාතාන්ත්‍රිය පාලනයක් පැවත්වීමට පහසු වනු ඇත. නිදහස් ලෙස සාකච්ජා කිරීම, විරුද්ධවාදී මත ඉවසීම, සමගි සම්මුතියට පැමිණීම, නිදහස් ලෙස සමාජ සබඳතා පැවත්වීම, යනු උක්ත ප්‍රජාතාන්ත්‍රිය මානුෂිය ගුණාංගවලින් කිහිපයකි. උක්ත ගුණාංග වලට අමතරව යම් රටක ප්‍රජාතාන්ත්‍රිය පාලන ක්‍රමයක් ක්‍රියාවෙහි යෙදීම පිණිස අවශ්‍යය වූ දේශපාලන උපකරණ කිහිපයක්ද ඇත.

එනම්:-

01) ඡන්දදායකයින්

02) දේශපාලන පක්ෂ

03) බහුතර පක්ෂය මගින් පාලනය

04) පාර්ලිමේන්තුව

05) කැබිනට් මණ්ඩලය

යන දේශපාලන උපකරණ ප්‍රජාතාන්ත්‍රිය පාලනයක් සඳහා අත්‍යාවශ්‍යකය.

'Parliamentary Democracy' යන ඉංග්‍රීසි වචනයෙන් හැඳින් වෙන ප්‍රජාතාන්ත්‍රික පාර්ලිමේන්තු ක්‍රමය. ක්‍රියාත්මක වන සෑම රටක්ම උක්ත දේශපාලන උපකරණ සෙවත් ආයතන වලින් නිසි ලෙස ප්‍රයෝජන ගනු ලබයි. උක්ත සියලු කරුණු අනුව අවබෝධ වනුයේ ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමයක ඇති වැදගත් කමයි. ජීවන දර්ශනය -Lebensphilosophie-[04] ප්‍රජාතාන්ත්‍රීය වූ දේශපාලනඥයන් යනු රටක වාසනාවකි.

ශ්‍රී ලංකා දේශපාලනයේ හිටපු පුද්ගලයන්ගෙන් ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමය නිරන්තරයෙන් අභ්‍යාස කරන අධිෂ්ඨානයේ ස්වාධිකාරිය ප්‍රගුණ කළ පූර්වාදර්ශීය දේශපාලනඥයා ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යය රනිල් වික්‍රමසිංහ මැතිතුමා බව අවිවාදිතය.

රනිල්

# අනාගතය දකින ඡන්ද දායකයන්

මහජනයා විසින් තෝරාපත් කර ගත් නියෝජිතයන් මගින් රට පාලනය කරවීම මහාජන ආණ්ඩුවක් පවත්නා බවට සාධකයකි. ඒ අනුව මහාජන නියෝජිතයන් වශයෙන් තෝරාගනු ලබන අයටත් ඒ සඳහා ඡන්දය හෙවත් කැමැත්ත දෙන ජනයාටත් පුළුල් භාරදූර වගකීමක් පැවරී ඇති බව මෙහිලා සැලකිය යුතු බලවත් සහ තීරණාත්මක කාරණයකි. මහජන නියෝජිතයන් තෝරා පත්කර ගැනීම සඳහා ජනයාට ලැබී ඇති අයිතිය වත්මන් පරපුරට පමණක් නොව අනාගත පරපුරටද බලපාන වගකීමකි. අද්‍යතනව ප්‍රජාතාන්ත්‍රීය පාලනයක් ක්‍රියාත්මක වන සියලු රටවල වයස 21 ඉක්මවූ ස්ත්‍රී පුරුෂ, උභය පාර්ශවයටම නියෝජිත මන්ත්‍රීවරු තේරීමේ බලය නොහොත් සර්වජන ඡන්ද බලය ලැබී ඇත. උක්ත සියලු දෙනා ඡන්දදායකයෝය.

ආණ්ඩු කිරීමේ කාර්යය මහජනයා විසින් තෝරා පත් කරගන්නා නියෝජිත මන්ත්‍රීවරුන්ට පැවරී ඇත. එහෙයින් මන්ත්‍රීන් තේරීම යනු ඇත්ත වශයෙන් ඡන්දදායකයන්ට අභිමත ආණ්ඩුවක් තෝරා ගැනීමයි. ඒ අනුව ආණ්ඩුව යනු ජනයා විසින්ම තමන් සහ තමන්ගේ පාලනය සඳහා තනා ගත් උපකරණයකි. යම් ආණ්ඩුවක් පොදුවේ රටේ වත්මන් සහ අනාගතයට ඵලදායි ආකාරයට ප්‍රජාතාන්ත්‍රීයව කටයුතු කිරීමට අපොහොසත් නම් ඊට වගකිව යුතු වන්නේ මහා ජනයා නොහොත් ඡන්දදායකයින්මය. ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමය පිළිබඳ අවබෝධය නොමැති අදක්ෂ දුර්වල පුද්ගලයන් තම දේශපාලන නියෝජිතයා වශයෙන් තෝරා පත් කර යැවීමෙන් වත්මන් පරපුර පමණක් නොව අනාගත පරපුරද බලවත් සහ තීරණාත්මක ආර්ථික අර්බුද, අධ්‍යාපනික ගැටලු, සමාජීය ප්‍රශ්න හා පාරිසරික ගැටලු ජාලයකට හසු වී විනාශ වනු ඇත.

අනෙක් අතට දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවෙන ස්වාභාවික විපත් වලට මුහුණ දී ජය ගැනීමට අවශ්‍යය දැනුම සහ සූදානම නොමැතිව රට මහා විපතකට මුහුණ දෙනු ඇත. ඊට සමගාමීව විවිධාකාර නොයෙක් රෝගාබාධ සඳහා අත්‍යවශ්‍යය බෙහෙත් වර්ග, කිරිපිටි සහ ආනයනය කළ යුතුම ආහාර පාන, යාන වාහන, යන්ත්‍ර සූත්‍ර, නොයකුත් වර්ගයේ අමතර කොටස්, විවිධ වර්ගයේ ඉන්ධන වර්ග සහ නව්‍ය දැනුම මෙන්ම උචිත විද්‍යා කාර්මික තක්ෂණය, වෛද්‍ය ක්ෂේත්‍රයේ නව්‍ය තක්ෂණය, නව්‍ය කෘෂි

තාක්ෂණය ලෝක වෙළෙඳ පොළින් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට අවශ්‍යය විදේශ විනිමය උපයා ගැනීමට සහ ප්‍රජාතන්ත්‍රවාදය අභ්‍යාස කිරීමට සහ නීතියේ සුජාතභාවය ආරක්ෂා කරගැනීමට නොහැකිව සමස්ත රටම අනතුරකට පත් වනු ඇත. සර්ව ජන ඡන්ද බලය අතිශය භාරදූර තීරණාත්මක වගකීමක් හැටියට සැළකෙනුයේ උක්ත කරුණු හේතුවෙනි. උක්ත වගකීමේ ඇති භාරදූරත්වය ගැන අවධානය යොමුකරන බොහෝ දේශපාලන විචාරකයෝ, ඕනෑම රටක ඡන්ද දායකයින් සෑහෙන උගත්කමක් ඇතිව සිටිය යුතු යැයි අවධාරණය කර ඇත.

මක්නිසාද යත් රටක තිරසර දියුණුවට සෘජුව බලපාන නීතියේ ආධිපත්‍යය, ආර්ථික, අධ්‍යාපනික, කාර්මික, සෞඛ්‍යය, ප්‍රවාහන, ක්‍රීඩා හා විදේශීය වෙළෙඳාම ආදී ප්‍රධාන අංශ වල දියුණුවට අදාල අවබෝධයක් නොමැති ඡන්ද දායකයින් රට පාලනයෙහි ගුරුත්වය ඇති, නව්‍ය දැනුම ඇති කාර්යක්ෂම පුද්ගලයන් මන්ත්‍රීවරු වශයෙන් තෝරා යැවීමට තරම් දැනුමෙන් අවබෝධයෙන් සම්පූර්ණ වී නොමැති හෙයිණි යනුවෙන් අදහස් ප්‍රකාශ වී ඇත. උක්ත ප්‍රකාශයෙහි සෑහෙන තරම් සත්‍යතාවයක් ඇතත් උගත්කම සෑම ඡන්ද දායකයෙකුටම අවශ්‍යය ගුණාංගයක් යැයි සැලකීමට නොහැකිය.

එංගලන්තයේ සර්වජන ඡන්ද බලය වැඩිදියුණු වූ ආකාරය විස්තර කෙරෙමින් දේශපාලන දාර්ශනික අයිවර් ජෙනිංස්[05] කර තිබෙන පහත සඳහන් ප්‍රකාශය මෙහිලා උපුටා දැක්වීම වැදගත්ය.

*'19 වන සියවසේ බ්‍රිතාන්‍ය කම්කරු පන්තිය අතර දේශපාලන උද්යෝගයක් පිබිදී ඇතිවී රට පුරා පැතිරී විසිරී ප්‍රචලිත විය. නමුත් ඊට සමානව පොත පතින් ලබන ශාස්ත්‍රීය අධ්‍යාපනය පැතිර ගියේ ඉතා සෙමිනි. කුමක් හෙයින් ද යත්, පොදු ජනයා අතර අධ්‍යාපනය පැතිර යාම දේශපාලන කටයුතු අතින් තම ආධිපත්‍යයට හානි වනු ඇතැයි මධ්‍යම පංතියේ පාලක පක්ෂය විශ්වාස කර ඊට අවශ්‍යය පහසුකම් අවශ්‍යතාවයට අනුව වැඩි දියුණු නොකිරීම හේතුවෙනි. ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාප්ත වීමෙහිලා ඇති එක් දුෂ්කර තාවයක් නම්, අධ්‍යාපන දියුණුවෙන් තොරව ප්‍රජාතාන්ත්‍රවාදය දියුණුවීම අපහසුවීමත්, ප්‍රජාතන්ත්‍රවාදයෙන් තොරව අධ්‍යාපන දියුණුව අපහසු වීමත්ය. වඩාත් වැදගත් ලක්ෂණය වුයේ පොත පතින් ලබන අධ්‍යාපනයට පළමු 'දේශපාලන අධ්‍යාපනය' පැතිර යාමයි. ඉතා නූගත් ජනතාවක් අතර වුවද, දේශපාලන අධ්‍යාපනය පැතිරවීම පහසුය.*

හොඳ ඡන්දදායක පිරිසක් ඇතිවීම පිණිස වුවමනා කෙබඳු උගත් කමක්ද? යනු උක්ත ප්‍රකාශයෙන් අපට පැහැදිලි වෙයි. යම් කෙනෙකු පොත පතකින් උසස් ඉගෙනීමක් ලැබූ පමණින් ඔහු හොඳ ඡන්ද දායකයෙකු විය නොහැකිය. රටේ පොදු කටයුතු අරභයා විශේෂයෙන් පාලන කටයුතු සම්බන්ධයෙන්, නිතර පරීක්ෂාවෙන් හා සැලකිල්ලෙන් සිටින පුද්ගලයෙකු වීම හොඳ ඡන්දදායකයෙකු පිළිබඳ එක් ලක්ෂණයකි. තමන් විසින් තෝරා පත්කර ගනු ලබන නියෝජිතයෝ කෙසේ රට ආණ්ඩු කෙරෙත් ද? ඔවුන්ගේ ක්‍රියා පටිපාටිය වැරදි සහිතද? රටේ යහපත සඳහා අත්‍යවශ්‍යයක කටයුතු මොනවාද? ආදී උක්ත කරුණු පිළිබඳව නිතර අවධානයෙන් සිටීම දේශපාලන ඉගෙනීමක් ඇති ඡන්දදායකයන්ගේ ප්‍රධාන ගුණාංග යැයි. මේ සඳහා උසස් ඉගෙනීමක් අනවශ්‍යය බව අප කාටත් අවබෝධ කරගත හැකි වනු ඇති මුත් දේශපාලන සාක්ෂරතාවය -Political literacy-[06] දියුණු කිරීමට කටයුතු කිරීමද දේශපාලන පක්ෂවලට පැවරි ඇති අත්නොහැරිය හැකි වගකීමකි.

තමන් ජිවත් වන සමාජය පිළිබඳව අවධානයෙන් පසු වීම හොඳ ඡන්දදායකයන්ගේ මූලික ලක්ෂණයකි. තමන්ගේ ගම, නගරය පළාත පිළිබඳව වූ පොදුජන කටයුතු වලට සහභාගීවීම සෑම හොඳ ගුණාත්මක ඡන්දදායකයයෙකු සතු වටිනා හා භාරදූර වගකීමකි, යුතුකමකි. එසේ නොවන රටවැසියන් පොදුජන යහපත මුල්කොට ගෙන කරනු ලබන සමාජ කටයුතු ගැන සැලකිල්ලක් දක්වන්නෙක් යැයි විශ්වාස කළ නොහැකිය. එවැනි පුද්ගලයන් අනෙකුත් අය හරහා සියලු දේ කරවා ගැනීමට උත්සාහ දරන පුද්ගලයන් වශයෙන් හැඳින්විය හැකිය. තම යුතුකම් නිවැරදිව ඉටු නොකර අන්‍යයන්ගේ ක්‍රියා විවේචනය කිරීමට අපට අයිතියක් නොමැති බව පළමුවෙන් සැළකිය යුතුය.

යුරෝපයේ රටවල් අතුරින් ජර්මනිය අනෙක් බොහෝ රටවලට වඩා උගතුන්ගෙන් ගහන වූ රාජ්‍යයකි. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය ජර්මනියේ ප්‍රතිෂ්ඨාපනය පිණිස දැරූ හැම ප්‍රයත්නයක්ම නිෂ්පල විය. 19-20 සියවස් වලදී ජර්මන් ජනයා ප්‍රජාතාන්ත්‍රිය ජිවිතයට පුරුදු නොවූ, දේශපාලන කටයුතු වලට නිතර මැදිහත් වීමට කැමැත්තක් පුරුද්දක් නැති, ජනතාවක් වීම එයට ප්‍රධාන හේතුවයි. පොදු ජනයා ආණ්ඩුව ගැන උනන්දුවක් නොදක්වන රටවල ඒකාධිපතියෝ බලයට පැමිණෙති. ඔවුහු රාජ්‍යය පිළිබඳ සියලු බලතල තම අතට ගෙන රටවාසී සමස්ත ජනතාව තම අභිමතය අනුව පාලනය කරති. ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර් ඊට කදිම උදාහරණයකි. නමුත් බ්‍රිතාන්‍ය

ජාතිකයෝ ඒකාධිපති බලය හැම කල්හීම පිළිකුල් කරති. එහෙයින් මහජන මතය ප්‍රබලව තබා ගැනීම පිණිස හැම විටම උත්සාහ දරති. මහාජන මතයට පිටුපා ක්‍රියා කළ පළමුවන චාල්ස්[07] හා දෙවන ජේම්ස්[08] යන රජුන්ට විරුද්ධව බ්‍රිතාන්‍ය ජනයා නැඟී සිටියේ ඒ නිසාය.

කවර ජනතාවක් අතර වුවද ප්‍රජාතාන්ත්‍රීය පාලනයක් පැවත්වීමට නම් සර්ව ජන ඡන්දබලය අත්‍යවශ්‍යය. සර්වජන ඡන්දබලය වෙනුවට දේපොළ අයිතිය හෝ උගත්කම අනුව දෙනු ලබන ඡන්ද බලය ප්‍රජාතාන්ත්‍ර ආණ්ඩුවක් නොව නිකම් මතිමාත්‍රයක් පමණි. ශ්‍රී ලංකාව හා ඉන්දියාව වැනි රටවල තවමත් ප්‍රධාන සහ තීරණාත්මක අඩුපාඩුව නම් ඉහත විස්තර කර ඇති ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමය තවම පොදුජනයා අතර මුල් බැස නොතිබීමය. ජාතිය අනුව හෝ කුලය අනුව හෝ බොහෝ දෙනා සිතීමට පෙළඹෙන්නේ ප්‍රජාතාන්ත්‍රීය දිවි පැවත්ම පුරුදු පුහුණු වී නොමැති විම හේතුවෙනි. විවිධ මත අතර නිදහස් සාකච්ඡා මගින් සමගි සම්මුතියට එළඹීමේ පුරුද්ද කෙමෙන් වැඩි වීමෙන් හා දියුණු වීමෙන් ප්‍රජාතන්ත්‍ර පාලනයක සැබෑ ප්‍රතිපල භුක්ති විදීමට හැකි වනු ඇත. මහජන නියෝජිතයන් වශයෙන් තෝරා පත්කර ගන්නා පුද්ගලයෝ නිවැරදි ලෙස කල්පනා කරන, සෘජු ලෙස කල්පනා කරන, පොදු යහපත උදෙසා උනන්දුවන, විරුද්ධ මත ඉවසන, අන්‍යයන් හා සහයෝගිතාවයෙන් වැඩ කරන බුද්ධිමත් විචාරශීලි පුද්ගලයන් විය යුතුය.

නිරන්තරයෙන් 'උණු කැඳ ඉල්වන' ලෙඩුන් මෙන් ආණ්ඩුවෙන් අපමණ දේ ඉල්ලමින්, පොදු ජන යහපත සඳහා ක්‍රියාත්මක නොයෙක් විධ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව උනන්දුවක් නොදක්වා හැමවිටම විරුද්ධවාදී ප්‍රතිපත්ති අනුගමනය කරන පුද්ගලයන් මහජන නියෝජිතයන් වශයෙන් තෝරා යැවීම ඡන්ද දායකයන්ට පමණක් නොව රටේ අනාගතයට ද කර ගන්නා බරපතල අනර්ථයකි. විරුද්ධවාදීන්ගේ අදහස්වල වුවද එහි ඇති යහපත් දේ අනුමත කොට, පොදු ජන අභිවෘර්ධිය සඳහා සමගි සම්මුතිවලට පැමිණීමේ ශක්තිය ඇති අවංක ප්‍රතිපත්ති දරන මධ්‍යස්ථ මතධාරීන් මහාජන නියෝජිතයන් හැටියට වඩා සඵලවන බව ලෝකයේ බොහෝ රටවල පාර්ලිමේන්තු ඉතිහාසයෙන් හෙළිදරව් වේ.

රනිල්

# දේශපාලන පක්ෂ

අවුරුදු 05 කට පසුව පාර්ලිමේන්තුවේ කාලය අවසන් වූ විට තම තමන් විසින් තෝරා පත්කර ගන්නා ලද නියෝජිත මන්ත්‍රීන් විසින් තමන්ට හෝ රටට හෝ සෑහෙන මෙහෙයක් ඉටුවී දැයි තීරණය කිරීමට ඡන්දදායකයින්ට ප්‍රස්තාවය ලැබේ. ඒ අනුව රටට සේවයක් නොකළ මන්ත්‍රීවරු පිටු දැකීමට ඡන්ද දායකයන්ට අවකාශ ඇත්තේය. මේ සඳහා විශාරද උගත්කමක් අවශ්‍යය නැත. ප්‍රකෘති බුද්ධිය ඇති ඕනෑම පුද්ගලයෙකුට මේ අනුව නිවැරදි තීරණය ගත හැකි වනු ඇත. ඕනෑම රටක පොදු අභිවෘද්ධිය සඳහා ස්ථිර ප්‍රතිපත්ති අනුව ක්‍රියාත්මක වන කණ්ඩායමකට 'දේශපාලන පක්ෂයක්' යයි කියනු ලැබේ. ඒ අනුව එවැනි වැඩ පිළිවෙලක් අනුගමනය කරන කණ්ඩායම් කිහිපයක් ඇති වූ විට එයින් වඩා හොඳ වැඩ පිළිවෙලක් තෝරා ගැනීම ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමය හුරුපුරුදු වූ සමාජයකට වඩා පහසුය. ඉන් පැහැදිළි වනුයේ ප්‍රජාතාන්ත්‍රීය පාලනයක් සඳහා දේශපාලන පක්ෂ තිබීම ඉතා වැදගත් බවයි. ප්‍රෙඩ්රික් ඔස්ටින්[09] නම් සුප්‍රකට ඇමරිකානු දේශපාලන විද්‍යාඥයා පක්ෂ ක්‍රමයක ඇති වැදගත්කම මෙසේ විස්තර කර ඇත.

මහා ජන ආණ්ඩුවකට දේශපාලන පක්ෂ වලින් ඇති ප්‍රයෝජන පස් වැදෑරුම්ය.

එනම්:-

1) පළමු කොට එකසමාන ලෙස හිතන ස්ත්‍රීන් හා පුරුෂයන් සමූහයකට පොදු ප්‍රතිපත්තීන් හා යෝජනා ක්‍රම සමූහයක් අරභයා එක්සත් ලෙස ක්‍රියා කිරීමේ ප්‍රස්තාවය ඒ මගින් උදාවන්නේය. පක්ෂයක් වශයෙන් සංවිධානය වීමක් නොමැතිව සමූහයක් වශයෙන් සිටින පොදු ජනතාවට නියමිත වැඩපිළිවෙලක් හි ස්ථිර ප්‍රතිපත්ති මාලාවක් හෝ විධිමත් සැලසුමක් හෝ යෝජනා වලියක් ක්‍රියාත්මක කිරීමට නොහැකිය.

2) දෙවනුව එක සමාන වූ පරමාර්ථයක් වෙනුවෙන් ක්‍රියාත්මක සාමාජිකයන් සමූහයකට තමන් විසින් මන්ත්‍රී ධූරය සඳහා ඉදිරිපත් කරන අපේක්ෂකයා කල් ඇතිව තීරණය කොට ඡන්ද දායකයින් හමුවෙහි එම අපේක්ෂකයාගේ සුදුසුකම හෙළිදරව් කිරීමට පක්ෂ ක්‍රමයට අනුව හැකිවීම.

3) තෙවනුව පුවත්පත් මගින්ද, මහාජන වේදිකාව මගින්ද සහ අනෙකුත් ප්‍රචාරක මාධ්‍යය මගින්ද මහා ජනයාට කරුණු ඉදිරිපත් කර මහාජන මතය ගොඩනැගීමටද, පොදු ජනයා දේශපාලන අර්බුධ, ප්‍රශ්න අරභයා සවිමත්ව හා ප්‍රබෝධමත්ව ඒකරාශීව තබා ගැනීමට දේශපාලන පක්ෂ ක්‍රමයෙන් අවස්ථාව ඇති වී ඇත.

4) සිව්වනුව තම හිතුමතාපය පරිදි නිදහසේ ක්‍රියාකරන යම්කිසි ආණ්ඩුවක් හෙවත් කැබිනට් මණ්ඩලයක් එක්සත් ක්‍රියාකාරී මණ්ඩලයක් වශයෙන් සමාජ හා දේශපාලන ක්‍රියා ජාලයකින් සවිමත්ව සමගියෙන් කටයුතු කිරීමට දේශපාලන පක්ෂ ක්‍රමය ඉතා ප්‍රයෝජනවත්ය.

5) පස්වනුව ආණ්ඩුව ඕනෑම අවස්ථාවක තියුණු දෝෂදර්ශනයට ලක් විය හැකි බව නිරන්තරයෙන් සිහිපත් කරණුයේ උක්ත පක්ෂ ක්‍රමයයි.

ලෝකයේ නොයෙක් රටවල පොදු අභිවෘද්ධිය සඳහා පිළියෙල කරගත් පැහැදිළි ස්ථිර ප්‍රතිපත්තියක් හෝ සංවර්ධන වැඩපිළිවෙලක් නොමැති දේශපාලන පක්ෂද ඇත. එබඳු පක්ෂ බොහෝවිට පිහිටුවා ගන්නේ ආගම හෝ ජාතිය යන කරුණු මුල් කරගෙන හෝ පුද්ගලයෙකු ප්‍රධාන කොටගෙනය. උක්ත ආකාරයේ දේශපාලන පක්ෂ කුමන හෝ රටක පොදු අභිවෘද්ධිය හා සාමයට අතිශයින් අනතුරුදායකය. මෙබඳු පක්ෂ හේතුකොට ගෙන රටේ ජාති භේද, ආගම් භේද ප්‍රධානව නොයෙක් අභිලාචාර භේද ඇවිස්සීමත් ආදී, උසස් මානව චාරිත්‍ර අභියෝගයට ලක්වන සමාජ ක්‍රියා හේතුවෙන් රටේ එක්සත්බව බිඳී යාමටත්, ආර්ථික, අධ්‍යාපනික හා පොදුවේ සමාජීය දියුණුව වසර සිය ගණනක් ආපස්සට යාමටත් හේතුවනු ඇත. ආගම් මුල්කරගෙන ඉන්දියාවේ පිහිටුවාගත් විශාල දේශපාලන සංගම් දෙකක් නිසා එක්සත් රාජ්‍යයක් වූ ඉන්දියාව භේදයෙන් භින්නව, පකිස්ථානය හා ඉන්දියාව යන රාජ්‍යය දෙකක් බවට පෙරළුණි. මෙවැනි දේශපාලන පක්ෂයෝ ප්‍රජාතාන්ත්‍රවාදය සඳහා ඉතාමත් අවශ්‍යය පොදු ජාතික හැඟීම් විනාශ කිරීමට පන්ති භේද, ආගම් භේද හා කුල භේද ආදිය අවුස්සති.

මෙවැනි පක්ෂ සහ සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ උනන්දුවන පුද්ගලයන් ගේ අවධානය යොමු වීම සහ ඒ පිළිබඳව මහා ජනසමාජය දැනුවත් කිරීම ඕනෑම රටක වත්මන් පරපුරට පමණක් නොව අනාගත පරපුරටද මහත් වූ සෙතක් වන බව විස්තර කළ යුතු නැත. සැබවින්ම

රනිල්

ප්‍රජාතාන්ත්‍රීය රටවල උක්ත ආකාරයේ පටු ආකල්ප සහිත දේශපාලන පක්ෂ පිහිටුවා ගැනීම අතිශයින් ම අනර්ථකරය. මෙවැනි දේශපාලන පක්ෂ වලට සම්බන්ධවීමෙන් ජාතිය හෝ ආගම අනුව සිතීමට විනා පොදු රටවාසීන් වශයෙන් සිතීමට පුරුදු නොවීම බලවත් සමාජීය තර්ජනයකි. අපේ අදහස් කලින් කල වෙනස් වන්නා සේ ම දේශපාලන පක්ෂවල අදහස් හා ප්‍රතිපත්තිද කාලයට ගැලපෙන අයුරින් වෙනස් වන අතරම ඒ අනුව තමන්ගේ පක්ෂයේන් ඉවත් වී තමන් කැමති පක්ෂයකට සම්බන්ධ වීමට ඇති අයිතිය ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණයකි. එහෙත් ජාතිය, ආගම, කුලය ප්‍රධානව ක්‍රියාත්මක වන පක්ෂයකින් ඉවත් වීමට කිසිවෙකුට නොහැකිය. මක්නිසාද යත්, ජාතිය, කුලය හෝ බොහෝ විට ආගමද මැරෙනතුරු වෙනස් නොවන හෙයිනි. එසේ හෙයින් ආගම් භේද, කුල භේද, ජාති භේද වලින් තොරව ක්‍රියාත්මක වන පක්ෂයක් යනු කුමන රටක වුවද ඉතා වටිනාතම සම්පතකි. එක්සත් ජාතික පක්ෂය යනු එවැනි උතුම් පරමාර්ථයෙන් දේශපාලනයේ නියුතු පක්ෂයකි.

The unity of government which constitutes you one people is …
a main pillar in the edifice of your real independence, the support of your
tranquility at home, your peace abroad; of your safety; of your prosperity; of
that very liberty which you so highly prize. But …
it is easy to foresee that, from different causes and from different quarters,
much pains will be taken, many artifices employed to weaken in your minds
the conviction of this truth; … this is the point in your political fortress
against which the batteries of internal and external enemies will be most
constantly and actively (though often covertly and insidiously) directed.

*-George Washington-*

*Farewell Address, September 19, 1796.*

# සැබෑ ප්‍රජාතාන්ත්‍රිකයෝ

සැබෑ ප්‍රජාතන්ත්‍රවාදියෝ තම මතය හැම විටම නිවැරදි විය යුතුයැයි කල්පනා නොකරන්නෝය. එහෙයින් අන්‍යයන්ගේ මතයටද කන්දීමට ඔහු නිතරම කැමතිය. දේශපාලනය අතින් ප්‍රතිවිරුද්ධ වූ මත සසඳා බලා විනිශ්චය කිරීම පිණිස විනිශ්චය සභාවක් නොමැති හෙයින් වැඩි දෙනාගේ කැමැත්තෙන් තීරණය කිරීමේ ක්‍රමය සැබෑ ප්‍රජාතන්ත්‍රවාදියා හැමවිටම අනුමත කරයි. මිනිසාගේ යහපත පිණිස හොඳම දේ මේ යැයි තීරණය කිරීමට බහුතර පක්ෂය හැමවිටම සමත් නොවිය හැකිය. එතකුදු වුවත් වැඩිදෙනාගේ යහපත පිණිස සුසුසු දේ කුමක් දැයි ටික දෙනෙකු විසින් තීරණය කිරීමට වඩා වැඩිදෙනකු විසින්ම තීරණය කිරීම ඉතාමත් ඵලදායි බව අවිවාදිතය. විරුද්ධ අදහස් ඉවසීමේ ලා බහුතර පක්ෂයද නිතර කැමැත්තක් දක්වන්නේ නම් වුවමනාවට වැඩියෙන් විරුද්ධ පක්ෂ වල සිත් නොරිදවා ආණ්ඩුව කර ගෙන යා හැකි බව බ්‍රිතාන්‍ය දේශපාලන විශාරදයෙකු වූ අයිවර් ඩබ්. ජෙනින්ග්ස් තම බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව[10] යන අදහස දෙන -The British Constitution- කෘතියේ විස්තර කර ඇත.

The best argument against democracy is a
five-minute conversation with the average voter.

*-Winston S. Churchill-*

රනිල්

# සැබෑ ඒකාධිපතියෝ

සැබෑ ඒකාධිපතියෝ, යම් කිසි දේශපාලන ධර්මයක් හෝ උග්‍ර මත සමුහයක් වැළඳගත් මිනිසුන් කල්ලියක් සමඟ සංවිධාන ගතවී රටක ආණ්ඩු බලය ලබා ගනී. ඉන් අනතුරුව තමන්ට අභිමත පරිදි ඒකාධිපති බලය යොදා ඔවුහු විරුද්ධවාදීන් විනාශ කරති. ඊට සමගාමීව තම පක්ෂයේ බලය සුරක්ෂිත කරගැනීම පිණිස රටවාසී මුලු මහත් ජනතාවම තියුණු වඩාත් ආකර්ෂණීය ප්‍රචාරයකින් තම මතයට නමා ගනු ලැබේ. එහෙත් අද්‍යතන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඒකාධිපතියන් මෙන් රටවාසී මුලු මහත් ජනතාවම තියුණු වඩාත් ආකර්ෂණීය ප්‍රචාරයකින් තම මතයට නමා ගැනිමට කටයුතු නොකිරිම ප්‍රජාතාන්ත්‍රීය ලක්ෂණයකි. නමුත් ශ්‍රී ලංකාවාසි ජනතාව පසුගිය දශ වසර පුරාම තියුණු වඩාත් ආකර්ශනීය ප්‍රචාරයන්ට වහල් වි සිටි බව සත්‍යයකි. එසේ හෙයින් වත්මන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දෝෂ දර්ශනයට ලක්වි ඇත්තේ අපේ මහා සමාජයේ සමාජීය සිතුවිලි හා ආකල්ප තව දුරටත් ප්‍රජාතාන්ත්‍රීය ජීවන ක්‍රමයට හුරු පුරුදු නොවිම හේතුවෙනි. එහෙත් ඒකාධිපතියෝ තමන්ට හැකිතාක් කල් නීතිය පිළිබඳ ශුද්ධ සිද්ධාන්ත සියල්ල අත්හැර දමා අත්තනෝමතික ලෙස සාවද්‍ය තොරතුරු ප්‍රචාරය කරමින් රට පාලනය කරනු ලැබේ. ඒකාධිපතියෝ නොහොත් ආඥාදායකයෝ පිළිබඳව බ්‍රිතාන්‍ය ජාතික දේශපාලන දාර්ශනිකයෙකු වූ ආචාර්ය හැරල්ඩ් ජේ. ලැස්කි'' මෙසේ ප්‍රකාශ කර ඇත.

*'ඒකාධිපතියන්ගේ පාලනය යනු අනන්‍යයන්ගේ වධ වේදනා ගැන කිසිවක් නොතකා අනුකම්පා විරහිත ලෙස සහාසික බලය පා රටේ පාලන බලය අත්පත් කර ගන්නා මිනිසුන්ගේ ආණ්ඩුවයි. ඔවුහු පුළුවන් හැම තැනමකම සත්‍යය නම් වූ උල්පතට වස යොදති. එසේ නොකළ තැන්හි සත්‍යය විනාශකර දැමීමට නොයෙක් විධ ආකාරයෙන් ක්‍රියා කරති. බලයෙන් බලයට පත්වීමේ ගිජු ආශාව විනා අන් කිසි නීතියක් හෝ නෛතික වගකීම් කිසිවක් ඔවුන් නොතකති. යුක්තිය හා ධර්මය පිළිබඳව මොවුහු තම පිළිකුල ප්‍රකාශ කරන්නා සේම තමන් ඇතුළත ඇති දයා විරහිත බව ජනවහරේ සිත් කා වදින වචන වලින් මහත් අභිමානයෙන් ප්‍රකාශ කරති. ඒකාධිපතියෝ නොහොත් ආඥාදායකයෝ ක්‍රියාත්මක රටවල ඔවුන්ගේ ජයග්‍රාහක සේනා ගමන් කළ මාර්ග වල විනාශයට පත් වූ මනුෂ්‍යයෝ සුන්වූ බලාපොරොත්තු වෙත්ද, නෂ්ඨ වූ ගරුත්වයෙන්ද යුක්තව විවිධාකාරයෙන් අබලන්ව වැතිර*

සිටිති. ඒකාධිපතියන්ගේ වංචා සහගත ක්‍රියා වලින් සපිරි වංකත්වය හා දූෂණ ක්‍රියා කලාපය බහුතර ජනයා අනුමත නොකරන මුත් සාධාරණ ලෙස ක්‍රියා කිරීම පිණිස ඔවුන් තුළ ඇති අපොහොසත්කම පැහැදිළිය. ඔවුන්ට ලැජ්ජාවක් ඇතත් ඊට එරෙහි වීමට ඇති ප්‍රජාතාන්ත්‍රිය දේශපාලන උපකරණ සියල්ල ඒකාධිපතියෝ නොහොත් ආඥාදායකයෝ විසින් අත්පත්කර ගෙන පොදු ජනයා බෙලහීන කර ඇත.'

යුක්ති සාධනය, යුක්ති සමර්ථනය, නොහොත් සයුක්ත කරණයට එරෙහිව අනීතික ක්‍රියා පතුරවමින් භීතිය වපුරමින්, අපහරණය ව්‍යාප්ත කරමින් ස්වාර්ථය ස්ථාපිත කරගැනීමේ ක්‍රියාවලිය සහ උපක්‍රම විනා රට වැසියාගේ ජීවිතය උසස් තත්ත්වයට පත් කිරීමේ සත් ව්‍යායාමයක් ආඥාදායකයන් ට කොහෙත්ම නොමැත.

අනෙක් අතට ගෝලීය දේශපාලන ඉතිහාසයට අනුව ඉතා හොඳින් පැහැදිලි වනුයේ ප්‍රජාතාන්ත්‍රිය පාලනයක් ස්ථාපිත කිරිමට උත්සාහ දරන බොහෝ අවස්ථා වලදී විවිධ රටවල ඒකාධිපතියන් ඒ ඒ රටවල ආර්ථික, සමාජීය හා නෛතික දියුණුවට බාධාකොට දේශපාලන බලය ග්‍රහනය කරගෙන ඇති ආකාරයයි. ඒ අනුව මහා ජනයා ස්ථිරව අවබෝධ කර ගත යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදය යනු වත්මන් පරපුරේ පමණක් නොව අනාගත පරපුරේද අත්තිවාරම බවයි. කුඩා එහෙත් ගලින් ගල සෙමින් සෙමින් ගලවා දැම්මෙන් මහා ගොඩනැගිල්ලක් වුවද පොළොවට සමතලා වනු ඇත. ඒ අයුරින්ම ප්‍රජාතාන්ත්‍රිය දේශපාලන වටිනාකම් අත් හිටවූ ජන සමාජයක අනාගතයද පොළොවට සමතලා වනු ඇත. එම නිසා ප්‍රජාතාන්ත්‍රිය ආණ්ඩුවක් යනු උසස් මානව චාරිත්‍ර ඇසුරෙන් දිර්ඝකාලීන යහපත උදාකෙරෙන තිරසර දේශපාලන ක්‍රියාවලියකි.[12]

Dictators are allergic to reform, and they are cunning survivors. They will do whatever it takes to preserve their power and wealth, no matter how much blood ends up on their hands. They are master deceivers and talented manipulators who cannot be trusted to change.

*-George Ayittey-*

රනිල්

# දේශපාලන විෂයට අදාළ විශිෂ්ඨයා

ශ්‍රී ලංකාවේ සිව් වරක්ම අගමැති ධුරයට පත් වී ඇති රනිල් වික්‍රමසිංහයන් අනාගතය පිළිබඳ දැනුම හා ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග උපයාගෙන ඇති විශිෂ්ටතම හා අවංක සාධාරණ ජාතික නායකයෙකි. ඔහු තමාගේ ජීවිතයෙන් වසර 40ක්ම තමා ජීවත් වන ශ්‍රී ලාංකික ජන සමාජය තිරසරව සංවර්ධනය කිරීම සඳහා අසීමිත උනන්දුවකින් හා බලවත් කැපවීමෙන් ක්‍රියා කරන උසස් දැනුමක් සහිත බලවත් දේශපාලනඥයෙකි. 'බලගතු ශ්‍රී ලංකාවක්' බිහිකිරීම සඳහා දැනුම මත පදනම් වූ ඉහළ තරඟකාරී සමාජ වෙළඳපොළ ආර්ථික ක්‍රමයට අනුව ශ්‍රී ලංකාව දියුණුකිරීම රනිල් වික්‍රමසිංහයන්ගේ ස්ථිර අධිෂ්ඨානය වී ඇත. උක්ත ඉලක්කය කරා ශ්‍රී ලංකාව තිරසරව මෙහෙයවීමට අවශ්‍යය විශේෂිත කාර්යභාරයන් ඉටු කළ හැකි ඉතාම හොඳින් දැනුම ඇති දේශපාලන විෂයට අදාල විශිෂ්ටයා -A subject matter expert- රනිල් වික්‍රමසිංහයන් බව අවිවාදිතය. දැනුම සහ දේශපාලනය -Knowledge and Politics- යනු රටක අනාගතය සාර්ථකත්වයට පත් කිරීම සඳහා අත්‍යවශ්‍ය සුදුසුකමකි.

ඔහු තම ජීවිත කාලයෙන් වසර 40 ක්ම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමැතිවරයෙක්, කැබිනට් ඇමැතිවරයෙක්, පාර්ලිමේන්තුවේ සභා නායකවරයෙක්, විපක්ෂ නායකවරයෙක් සහ පක්ෂ නායකයෙක් මෙන්ම සිව් වරක් ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරයට පත් වූ මහා අත්දැකීම් සම්භාරයක් ඇති නායකයෙකි. ඔහුගේ වසර 40 ක පාර්ලිමේන්තු ජීවිතයේ ඔහු හමුවී සාකච්ජා කර ඇති ලෝක දේශපාලන නායකයන්, අධ්‍යාපනඥයන්, ආර්ථික විද්‍යාඥයින්, කාලගුණ විද්‍යාඥයින්, සාගර විද්‍යාඥයින්, සමාජ විද්‍යාඥයින්, පුරා විද්‍යාඥයින්, අභ්‍යවකාශ විද්‍යාඥයින්, ඉතිහාසඥයන්, මානව විද්‍යාඥයින්, කෘෂි තාක්ෂණික විද්‍යාඥයින් ආදී විද්වතුන් දහස් ගණනක් වීම අනිවාර්‍යයය. අනෙක් අතට ඔහු විසින් සහභාගී වී ඇති සම්මන්ත්‍රණ හා විවිධ ගෝලීය හා ආසියානු යුරෝපිය සමුළු අනුව ඔහුගේ දැනුම කෙතරම් දැයි උපකල්පනය කිරීමට පවා නොහැක.

ඔහු, සොබාදහමේ ද, නීතියේ ද, සාමයේ ද, සියලු ජාතීන්ගේ ද මිත්‍රයකු වන අතර ධාර්මික ප්‍රතිපත්ති ද චිරාගත චාරිත්‍ර ද ඇසුරු කරමින් නවීන විද්‍යා තාක්ෂණික සමාජ චාරිත්‍ර අභ්‍යාස කරමින් ශ්‍රී ලංකාව ආර්ථිකව හා සමාජීය වශයෙන් සංවර්ධනය කිරීමෙහි ද අති දක්ෂයෙකි. එමෙන්ම රනිල් වික්‍රමසිංහයන් නීතියට අයිති අයිතිවාසිකම් වලට එරෙහිව දේශපාලන බලය භාවිතා නොකරන අතර දේශපාලන දැනුමෙන් හා විවිධාකාර නවීකරණයන් පිළිබඳ සවිස්තර සවිද්‍යා දැක්මක් සහිත ලොව සිසාරා කීර්තියට ලක් වූ ශ්‍රී ලාංකික දේශපාලනඥයෙකි.

එමෙන්ම ඔහු තමන් දැඩි කුසාග්‍ර බුද්ධිමතෙක් ලෙස හුවා දක්වන්නට මහන්සි ගන්නා පුද්ගලයෙකුද නොවන අතර පවිත්‍රකම හා ව්‍යාජ මිත්‍රශීලී බව මෙන්ම උග්‍ර ආගම්වාදී ලක්ෂණ මතු කොට දක්වා අනුන් වශී කරවා ගැනීමට කුරුමානම් අල්ලන්නෙක්ද නොවේ.

ඔහු තුළ ඇති චරිත ලක්ෂණ ඔහුගේ සැබෑ පෞරුෂය තුළින්ම විහිදී දර්ශනය වන ස්වජීව ගුණයක්ම පමණි. ඔහු ආත්ම සංයමයෙන් යුතු යහපත් චරියාමය ලක්ෂණ සපිරි මානව දයාවෙන් පිරුණු සවිනය සව්‍යවහාරික සුගෝපිත දේශපාලනඥයෙකි. සාධ්‍යඥානය යහපත්ව අනුගමනය කරමින් පිළිපදිමින්, යුක්තිය, කරුණාව, මුදිතාව, උපේක්ෂාව හා සමානාත්මතාවය කෙරේ අසීමිත මානසික නැඹුරුවකින් හෙබි රනිල් වික්‍රමසිංහයන් ශ්‍රී ලංකාවේ දියුණුව වෙනුවෙන් තම නිරහංකාර අල්පේච්ඡ ජීවිතය අභ්‍යාස කරන විශිෂ්ට මිනිසෙකි.

ඔහු දේශපාලන සමගිය ඇති කිරීමෙහි ලා ආගම් සහ භාෂා ප්‍රබල සාධකයෝ බව තම ප්‍රභාවිත දැනුමෙන් ඉතා හොඳින් අවබෝධ කර ගත් දේශපාලනඥයෙකි. එම නිසා සාධාරණත්වය පිරුණු, පැතිරුණු හා රජයන මිනිසුන්ගෙන් සමන්විත යහපත් දියුණු සමාජයක් ගොඩනැගීම ඔහුගේ ව්‍යායාමය වී ඇත. සමාජය පිරිසිදු කරමින් පුද්ගලයා පිරිසිදු කෙනෙකු බවට පත් කළ හැකි බවත් ඒ නිසා පෞද්ගලික අවශ්‍යතා වලට වඩා සාමාජික අවශ්‍යතා සපුරාලිය යුතු බව ඔහුගේ ක්‍රමයයි.

මේ පිළිබඳව ප්ලේටෝ[13] පහත පරිදි තර්කයක් ඉදිරිපත් කර ඇත.

'පුද්ගලයා ස්වයංපෝෂිත පුද්ගලයෙකු නොවන නිසා ඔහුට අවශ්‍ය සියල්ල ඔහු විසින්ම සපයා ගැනීමට නොහේ, සමාජය ඇති වුයේ මිනිසාගේම අවශ්‍යතා සපුරාලීම සඳහායි' යනුවෙනි.

යහපත් සමාජයක් යනු සූරාකෑම්, මංකොල්ල කෑම්, අල්ලස් ගැනීම්, ආදී දූෂණ වලින් සම්පුරණයෙන් මිදුණු පරිසරයකි. එහෙයින් උක්ත සමාජය ආහාරපාන, පිරිසිදු පරිසරය, ඉඳුම්හිටුම්, කාර්යක්ෂම ගමනා ගමනය, විනෝදාත්මක පහසුකම්, කලා හා ක්‍රීඩා ආදී මුලික අවශ්‍යතා වලින් පරිපූර්ණය. නොයෙක් විධ සම්භාධක වලින් තොරව තම තමන්ට අවශ්‍ය සියලු දේ ලබා ගැනීමටත් නිදහස ගුණාත්මකව භුක්ති විඳිමින් නිදහසේ ජිවත් විමට හැකි වීම එහි විශේෂත්වයයි. එවන් සමාජයක් වෙනුවෙන් දියුණු අධ්‍යාපනයක් ලබාදෙන පාසල් හා උසස් අධ්‍යාපන ආයතන, ප්‍රමාණාත්මක ඒක පුද්ගල අදායමක් උපයාගත හැකි ආර්ථික ක්‍රමයක්, අවශ්‍යය පමණට විදේශ විනිමය ඉපයීමට සමත් ගෝලීය වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් කාර්මික හා කෘෂිකාර්මික ආර්ථිකයක් සහ ක්‍රමවත් සංචාරක ව්‍යාපාරික සංවර්ධනයක් ඇති කළ යුතුය. උක්ත ඉතා තීරණාත්මක ජාතික අවශ්‍යය තාවය ඉටු කරගැනීම සඳහා එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහයන් ක්‍රියාත්මක කර ඇත්තේ සමාජ වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයයි. සමාජ වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය යනු ඇඩොල්ෆ් හිට්ලර් විසින් බිමට සමතලා කරන ලද ජර්මනිය නැවත බලවත් රාජ්‍යයක් බවට පත් කරන ලද ආර්ථික ක්‍රමයයි.

ශ්‍රී ලංකාවට අවශ්‍යය ඛනිජතෙල්, ළදරු කිරිපිටි, බෙහෙත් වර්ග ප්‍රධානව ඉතා තීරණාත්මක පොදු අවශ්‍යතා රාශියක් ලෝක වෙළෙඳපොළෙන් ශ්‍රී ලංකාව මිලදී ගනුයේ මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකිකයන් උපයන විදේශ විනිමයනි. වසර 20 කට වැඩි කාලයක් ඇතුළත දී මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකිකයන් උපයන විදේශ විනිමය වෙනුවට විකල්ප විදේශ විනිමය උපයන මාර්ග දියුණු කිරීමට ශ්‍රී ලංකාව අසමත් වී ඇත. මෙකී තත්ත්වය ශ්‍රී ලංකාවේ අනාගතයට බරපතල තර්ජනයකි. එම නිසා පොදු ජනයාට කායික හා මානසික හෝ පිඩාවලින් තොරව ජීවත්වීම සඳහා ආර්ථික, සාංස්කෘතික දේශපාලනික මෙන්ම සාමාජික අවස්ථාවලින් සපිරි සමාජ ස්ථරයක් ගොඩනැගීම රනිල් වික්‍රමසිංහයන්ගේ ප්‍රධාන ඉලක්කයකි. (දීඝ නිකායේ, කුට දත්ත සූත්‍රය හා සසඳාලන්න) ඒ සඳහා ගෝලීය දේශපාලන දැනුම සහ නවීන තාක්ෂණික දැනුම සහ ගෝලීය වෙළෙඳ පොළ පිළිබඳ දැනුම අත්‍යවශ්‍යය. අනෙක් අතට ගෝලීය බලවතුන් සමග කටයුතු කිරීම

සදහා ගෝලීය දේශපාලන බලයද තිබිය යුතුය. බලය හා ඉවසීම අතර ඇතිවූ දීර්ඝ අර්බුදයේදී ප්‍රමාණවත් තරම් ව ඉවසීමේ තාදී ගුණය ප්‍රගුණ කළ රනිල් වික්‍රමසිංහයන් සමස්ත ලෝක දේශපාලන සමාජයටම බලපෑම් කළ හැකි දැනුමෙන් සහ අත්දැකීමෙන් පිරුණු බලවත් දේශපාලනඥයෙකි. ඔහු මෙකී කරුණු වලට අනුව සමස්ත ගෝලීය දේශපාලන සමාජයටම  මහත් වූ ආදර්ශයක් වී ඇත.

ප්ලේටෝ පඬිවරයාගේ අදහස වී ඇත්තේ 'මිනිසාගේ සැබෑ චරිතය අවබෝධ වනුයේ ඔහු බලය සමග ක්‍රියාත්මක වීමේදී' බවයි.  The measure of a man is what he does with power - *Plato*

රනිල් වික්‍රමසිංහයන්ගේ දේශපාලන ඉතිහාසය විචාරයේදී ඔහු බලය අත්හැරීම පිළිබඳව දක්වා ඇති පූර්වාදර්ශ ඉතාමත් ප්‍රශස්තය. ඔහු එවැනි සෑම අවස්ථාවකම තමන් ගැන නොව තමන්ගේ රටේ අනාගතය පිළිබඳව සිතා කටයුතු කර ඇති සැබෑ දේශානුරාගී නායකයෙකි. දේශපාලන ක්‍රියාවලියේදී බලය ලබාගැනීමේ දී මෙන් නොව බලය අත්හැරීම තීරණාත්මකය. බලය අත්හැරීම ප්‍රජාතාන්ත්‍රික සහ අනාගතයට ආදර්ශයක් වන අයුරින් ක්‍රියාත්මක කළ හැක්කේ දැනුම වර්ධනය කරගත් දියුණු පුද්ගලයන්ට පමණක් බව දේශපාලන දාර්ශනික මතයයි. ශ්‍රීමත් ප්‍රැන්සිස් බේකන් ප්‍රකාශ කර ඇත්තේ 'දැනුම බලය' බවයි.  -Knowledge is power - *Sir Francis Bacon*-. දැනුම විවිධාකාරය. දැනුම පිළිබඳ න්‍යායයන් -Theories of knowledge-. විද්‍යාත්මක ඥානය -Scientific knowledge-. පශ්චාත් දැනුම -Meta knowledge-. කාර්ය පටිපාටිය දැනුම -Procedural knowledge-. ප්‍රතීති ඥානය -Knowledge by acquaintance-. වර්ණිත ඥානය -Knowledge by description-. යථාර්ථ ඥානය -Knowledge of reality-. නිර්දිෂ්ටි ඥානය -Knowledge of specifics-. ආදී වශයෙන් තවදුරටත් විවිධාකාරය. කරුණු, තොරතුරු සහ අත්දැකීම් මෙන්ම අධ්‍යාපනය තුළින් අත්පත් කරගත් නොයෙක් විෂයන් පිළිබඳ න්‍යායාත්මක අවබෝධය සහ කුසලතා ඇතුළු ප්‍රායෝගික අවබෝධය දැනුම වශයෙන් අර්ථගැන්වී ඇත. ශ්‍රී ලංකාවේ අනාගතය වෙනුවෙන් රනිල් වික්‍රමසිංහන්ගේ දේශපාලන දැනුම, දේශපාලන ආර්ථික දැනුම, දේශපාලන පරිසරවේදය පිළිබඳ දැනුම හා තිරසාර කාර්මිකකරණය පිළීබඳ දැනුම ඉතා ඉහළ මට්ටමක පවතින බව උක්ත කරුණු අනුව ඉතා පැහැදිළිය. උක්ත දැනුම් ජාලය එතුමන් විසින් ඉතා කැපවීමෙන් අධ්‍යනය කොට තමන් උපන් රටේ අනාගතය වෙනුවෙන්

අභ්‍යාස කර ඇති ආකාරය අනෙකුත් දේශපාලනඥයන්ට බලවත් ජීවමාන ආදර්ශයකි.

දේශපාලනය පිළිබඳව සිතීමට වැඩි කාලයක් වැය කිරීම රට වැසියන්ට 'වඩා හොඳ' විය හැකි බවට තර්කයක් ඇත.



*Aristotle*

ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ප්‍රජාතාන්ත්‍රික පුරවැසියන් අවශ්‍ය බව මෙන්ම ඇරිස්ටෝටල්ද අවධාරණය කර ඇත. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා දේශපාලන දැනුම තීරණාත්මකය.දේශපාලන දැනුම -political knowledge- යනු දේශපාලන සන්නිවේදන පර්යේෂණවල කේන්ද්‍රීය වැදගත්කමක් උසුලන සංකල්පයකි. අද්‍යතන දේශපාලනික දැනුම දේශපාලන සූක්ෂමතාවය හා වත්මන් තත්ත්වය මෙන්ම අනාගතය පිළිබඳ නිසි දේශපාලන විශේෂඥභාවයෙන් පරිපූර්ණ විය යුතු බව ගෝලීය පිළිගැනීමයි. දේශපාලන දැනුම පිළිබඳ පර්යේෂණ බොහොමයක් ප්‍රධාන කරුණු දෙකකට අවධානය යොමු කර ඇත.

01./ ඵලදායී ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගැනීමට මහ ජනතාවට ප්‍රමාණවත් දේශපාලනමය දැනුමක් තිබේද?

02./දැනුවත් පුරවැසි භාවය නිර්මාණය කිරීම හා නඩත්තු කිරීමේදී සන්නිවේදනය ඉටු කරන කාර්යභාරය කුමක්ද?,

යනු එම කරුණුය. එක්සත් ජනපදයේ මෙන්ම අනෙකුත් ප්‍රජාතාන්ත්‍රික ජාතීන් ද දේශපාලන දැනුම පිළිබඳ අධ්‍යනය ප්‍රජාතන්ත්‍රික මූලධර්ම තුල මුල් බැස ඇති බව හඳුනාගෙන ඇත. දේශපාලන දැනුම මගින් ප්‍රජාතාන්ත්‍රික සමාජයක් සඳහා සහභාගි වීමට පුරවැසියන් දැනුවත් කළ යුතු බව පොදු පිළිගැනීම වී ඇත.

තොරතුරු අධ්‍යනය මෙන්ම දත්ත පිළිබඳ අවබෝධය මෙන්ම ජන සමාජයේ තොරතුරු සාක්ෂරතාවය -Information literacy- ඩිජිටල් සහ මාධ්‍ය සාක්ෂරතාවය -Digital and media literacy- ගෝලීය සාක්ෂරතාවය -Global Literacy- දේශපාලන සාක්ෂරතාවය -Political literacy- බහු සංස්කෘතික සාක්ෂරතාවය -Multicultural literacy - Cross-cultural understanding- සමාජ සාක්ෂරතාවය -Social literacy- සංස්කෘතික සාක්ෂරතාවය -Cultural literacy- ප්‍රජා සාක්ෂරතාවය -Civic literacy- මූල්‍ය සාක්ෂරතාවය -Financial literacy-විද්‍යාත්මක සාක්ෂරතාවය -Scientific literacy- ලේඛන සාක්ෂරතාවය -Document literacy- සෞඛ්‍ය සාක්ෂරතාව -Health literacy- කාලගුණ සාක්ෂරතාවය -Weather literacy- හැඟීම් සාක්ෂරතාවය -Emotional literacy- භූ සාක්ෂරතාවය -Geo-literacy- පාරිසරික සාක්ෂරතාවය -Environmental Literacy- ඇතුලු තවත් සාක්ෂරතා රටක සමාජීය දියුණුවට ඉතා වැදගත්ය.

අනෙක් අතට රාජ්‍යය නායකයෙකුට දේශපාලන ආර්ථිකය -Political economy- පිළිබඳව ඇති දැනුමද ඉතා තීරණාත්මකය. දේශපාලන ආර්ථිකය යනු නිෂ්පාදනය සහ වෙළෙඳාම පිළිබඳ අධ්‍යනයයි. දේශපාලන ආර්ථිකය සදාචාරාත්මක දර්ශනය තුලින් ආරම්භ විය. දේශපාලන ආර්ථිකය බොහෝවිට ආර්ථික ප්‍රතිපල තීරණය කිරීමේදී දේශපාලන සාධක වල තීරණාත්මක භූමිකාව පැහැදිළිකර ගැනීම සඳහා ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, නීතිය, ඉතිහාසය, සමාජ විද්‍යාව හා අනෙකුත් විෂයන් කෙරෙහි අන්තර් විෂය දැනුම යනුවෙන් අදහස් වේ. අද්‍යතන ආර්ථික විද්‍යාව සඳහා අර්ථකථනයක් ලෙස භාවිතා නොකරන දේශපාලන ආර්ථිකය නීතිය හා බැඳුණු නෛතික චාරිත්‍ර හා රජය සමග සම්බන්ධතා මෙන්ම ජාතික ආදායම සහ ධනය බෙදාහැරීම සහ නවෝත්පාදන හැකියාව යන කරුණු දේශපාලන ආර්ථික දැනුමේ ඇති විශේෂිතවූ හැකියාවන්ය. 18 වන සියවසේදී, රාජ්‍යයන්වල ආර්ථිකයන් අධ්‍යනය කිරීමක් වශයෙන් හා දේශපාලන ආර්ථිකය, රාජ්‍ය මට්ටමේ ධනය නිෂ්පාදනය කිරීමේ නීති ප්‍රකාශ කිරීම සඳහාද ක්‍රියාතමක වී ඇත.

1805 දී තෝමස් රොබට්ස් මැල්තස් -Thomas Robert Malthus- එංගලන්තයේ දේශපාලන ආර්ථිකයේ ප්‍රථම මහාචාර්යවරයා බවට පත්විය.

එමෙන්ම දේශපාලන පරිසර දැනුමද ඉතා තීරණාත්මකය. -Political ecology- යනු පාරිසරික ගැටළු හා වෙනස්කම් සමඟ දේශපාලන, සංවර්ධන ආර්ථික හා සමාජ සාධක අතර සබඳතා අධ්‍යනය කිරීමය. මානව විද්‍යාව, වන විද්‍යාව, සංවර්ධන අධ්‍යනයන්, පාරිසරික සමාජ විද්‍යාව, පාරිසරික ඉතිහාසය සහ භූගෝලීය විද්‍යාව යන ක්ෂේත්‍රයන් දේශපාලන පරිසර අධ්‍යනයට ඇතුළත් වී ඇත. 'දේශපාලන පරිසර විද්‍යාව' යන යෙදුම ඇමරිකානු මහාචාර්යවරයෙකු වන තෝමස් ජේ බැසට් -Thomas J. Bassett - විසින් 1988 දී භූගෝලීය ප්‍රකාශනයක් ලෙස භාවිතා කර ඇත. භූගෝල විද්‍යාඥයෙකු වන මහාචාර්ය මයිකල් වොට්ස් -Michael J. Watts- ප්‍රකාශ කරනුයේ 'ස්වභාවික පාරිසරික සම්පත්වලට දේශපාලන බලයේ බලපෑම මුදාහරින ප්‍රමාණය අනුව පරිසර සුරක්ෂණ ක්‍රියා සක්‍රිය කළ යුතු බවයි'. අද්‍යතන දේශපාලන ආර්ථිකයේ කේන්ද්‍රීය ක්ෂේත්‍රය වනුයේද දේශපාලන පාරිසරික දැනුමයි. තමා පාලනය කර ගන්නා අන්දම අවබෝධ කර ගැනීමට පෙර ස්වභාව ධර්මය පාලනය කිරීමට මිනිසාට ලැබී ඇති අයිතිය නිවැරදිව ක්‍රියාත්මක වනවාද නැද්ද යන කාරණය මත මිනිසාගේ අනාගතය රැඳී ඇත. ඒ අනුව ස්ථිර වශයෙන්ම දේශපාලනය යනු ඉතා තීරණාත්මක සමාජ ක්‍රියාවලියකි. උක්ත දැනුම් සම්භාරයට පමණක් රනිල් වික්‍රමසිංහයන් සීමා වී නැත.

# පන්සල් පොත් හත

ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතික දැනුමේ ආරම්භය පහත සදහන් පොත් හත කියවීමය. දැනුම යනු අතීතය මෙන්ම අනාගතය විචාරශීලිව දකින විශිෂ්ටතම ක්‍රියාවලියකි. මීට වසර 20 කට 30 කට පෙරදී සිංහල බෞද්ධ පවුල්වලට ලැබෙන දූ දරුවන්ට නැකතට අකුරු කියවීමෙන් පසුව තව දුරටත් තම මව් භාෂාව ප්‍රගුණ කිරීම සදහා පන්සල් පොත් හතක් කියවිය යුතු විය.

01. හෝඩිය
02. නම් පොත
03. මඟුල් ලකුණ
04. ගණදෙවි හෑල්ල
05. වදන් කවි පොත
06. බුද්ධ ගජ්ජය
07. සකස්කඩ

උක්ත පන්සල් පොත් හතය. රනිල් වික්‍රමසිංහයන් තම ළමා කාලයේදී උක්ත පොත් හතම කියවූ සැබෑ දේශප්‍රේමී සිංහල බෞද්ධයෙකි. හෝඩිය, සිංහල හෝඩිය, පන්සල් හෝඩිය කියවූ රනිල් වික්‍රමසිංහයන් දේශීය, විදේශීය දැනුම ඉතා හොඳින් උපයාගෙන ඇති බලවත් නායකයෙකි. රනිල් වික්‍රමසිංහයන්ගේ සංස්කෘතික අභාෂය පිළිබඳව ප්‍රශ්න කරන පුද්ගලයන් උක්ත පොත් කියවා අවබෝධ කරගෙන නොමැති බව ඔවුන්ගේ තීරණ සහ ක්‍රියා අනුව ඉතා හොඳින් හෙළිදරව් වී ඇත.

True patriotism is better than the wrong kind of piety.

*-Abraham Lincoln-*

**සැබෑ දේශප්‍රේමය ව්‍යාජ සැදැහැවත් කමට වඩා උසස්ය.**

රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ රාජ්‍යතාන්ත්‍රික මිතුදම් පෙර අපර දිග සිසාරා විහිදී ඇති අතර ඔහුගේ දැනුම හා බුද්ධිය සිංහල සංස්කෘතික උරුමයන් හා බැදුණු බෞද්ධ ශික්ෂණයෙන් සමුද්ධරණය වී ඇත. ඔහු පරිණත මෙන්ම

සමතැස් දේශපාලනඥයෙකු පමණක් නොව සාහිත්‍යධරයෙකු ද වන අතර බොහෝ විෂය පථයන් පිළිබඳ ප්‍රාමාණික දැණුමෙන් ප්‍රභාවිත වූ පූර්ණකාලින දේශපාලනඥයෙකි. ඔහුගේ ශාස්ත්‍රීය අභිලාශයන් වනුයේ සිංහල භාෂාව හා සංස්කෘතිය උදාරත්වයෙන් පරිශීලනය කිරීම ප්‍රධානව ලාංකික ජාතියේ ශාස්ත්‍රීය නිපුණත්වයයි.

රනිල් වික්‍රමසිංහ යනු විවිධ දැනුමෙන් පිරිපුන්, ඉවසීමෙන් සපිරි, දශත පැතිරුණු නවීන විද්‍යා තක්ෂණික දැනුමෙන් රටේ අනාගතය ගැන සිතන සැබෑ බෞද්ධ ජාතික නායකයෙකි. ඔහු ශ්‍රී ලංකාවේ අතීතය ඉතා හොදින් හදාරා ඇති අතර ඒ අතීතයේ වටිනාකම් සමගින් ශ්‍රී ලංකාව ආර්ථීක, අධ්‍යාපනික හා සමාජීය වශයෙන් දියුණු රටක් බවට පත් කිරීමට නවීන දේශපාලන දැක්මක් සහිත බලවත් පූර්ණකාලින ජාත්‍යන්තර තලයේ දේශපාලනඥයෙකි. බලවත් දැනුමෙන් සහ බලවත් විදේශ සබඳතා ඇති සහ ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ වැඩිම මනාප ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් දේශපාලනඥයාද වනුයේද රනිල් වික්‍රමසිංහයන්ය.

The wise man must not be ordered but must order, and he must not obey another, but the less wise must obey him.

*-Aristotle-*



ඔහුගේ ආදර්ශ කණ්ඩායමේ බුදුන් වහන්සේ ප්‍රමුඛ පෙර අපර දිග දාර්ශනිකයන් ඇතුලු නූතන ආර්ථික සමාජ හා විද්‍යාත්මක තාක්ෂණික සංවර්ධනයේ නොබෙල් ත්‍යාග ලාභීන්ද රාශියකි. ඔහුගේ සංස්කෘතික පාරාදීසිය වී ඇත්තේ අපේ මහා සංස්කෘතියයි. ඔහුගේ ධනය වනුයේ ප්‍රභාවිත දැනුමයි. එමෙන්ම ජාතිවාදය, ආගම් වාදය, කුල වාදය, ගෝත්‍ර වාදය, නිකාය වාදය දේශපාලන ජයග්‍රහණ වෙනුවෙන් භාවිතා නොකිරීමේ ස්ථිර ප්‍රතිපත්තිය රනිල් වික්‍රමසිංහයන්ගේ චරිතයේ දශක 04 ක් තිස්සේ අභ්‍යාස කෙරෙන අති ශ්‍රේෂ්ඨ මානව ගුණාංගයකි.

The wise man belongs to all countries,
for the home of a great soul is the whole world.
*-Democritus-*

**බුද්ධිමත් මිනිසා සියලුම රටවලට අයත්ය.**
**මක් නිසාදයත් ශ්‍රේෂ්ඨ ජීවය යනු සමස්ත ලෝකය වන හෙයිණි.**

විශේෂයෙන් බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුව මිනිස් සංහතියේ උසස් මානව චාරිත්‍ර ශ්‍රී ලාංකික සමාජ චරිතයේ ස්ථාවර කිරීමට රනිල් වික්‍රමසිංහයන් දරන ඒකායන උත්සාහය පොදු ජන සමාජයට ආදර්ශමත් මෙන්ම උතුම් ව්‍යායාමයකි. අනෙක් අතට පොදුජනයා අමතක නොකළ යුත්තේ දේශපාලනයේ දී අවංකභාවය තරම් වටිනා උරුමයක් තවත් නොමැති බවයි. එම උරුමයට හොඳම තවත් එක් ආදර්ශයක් වනුයේ රනිල් වික්‍රමසිංහයන්ය.

Being happy is knowing how to be content with little.
*-Epicurus-*

# ඔබ දන්නවාද?

රනිල් වික්‍රමසිංහයන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සිව් වරක් අග්‍රාමාත්‍ය ධුරය හොබවා ඇත. එහෙත් ඔහු එක් දිනක් හෝ අග්‍රාමාත්‍ය නිල නිවස වන අරලියගහ මන්දිරයේ ජීවත් වී නැත. ඔහු අගමැති ධුරය දැරූ සිව් වතාවේම තමන්ගේ නිවසේ සිට රාජකාරිය සඳහා පමණක් අරලියගහ මන්දිරයට පැමිණ ඇත. තමන් වරිපනම් ගාස්තු ගෙවන පුද්ගලික නිවසේ සිට රාජකාරි කිරීමට පැමිණීම ඔහුගේ දේශපාලන කැපවීම පිළිබඳ ඉතා කුඩා ආදර්ශයකි.

කුමන හෝ පුද්ගලයෙකු තම දේපල වැරදි ලෙස පරිහරණ නොකිරීම රජයේ වගකීම වේ යන නෛතික මූලධර්මයට උක්ත ක්‍රියාව ආදර්ශයකි. -Interest Reipublicae Ne Sua Re Quis Male Utatur- *(It concerns the State that no one should make a wrongful use of his property)* සැබවින්ම අවවාදයට වඩා ආදර්ශය උතුම් බව ශ්‍රී ලංකා වාසීන් සියලු දෙනා හොඳින් දන්නා මානව චාරිත්‍රයකි. රනිල් වික්‍රමසිංහ ජන බැඳියා විෂයක කරුණු -Matter of public Interest- පෞද්ගලික යහපත සඳහා -Pro private commdo- නොව ශ්‍රී ලාංකික ජන සමාජයේ උන්නතිය වෙනුවෙන් අභ්‍යාස කිරීමට ජීවිතය පුරා පුරුදු පුහුණු වූ ප්‍රජාතාන්ත්‍රීය පීවන ක්‍රමය නිරන්තරයෙන් අභ්‍යාස කරන විශිෂ්ටතම ජන නායකයෙකි. මක්නිසාද යත් වෘත්තීය දේශපාලනඥයින් ජන අවශ්‍යතාව පෞද්ගලික අවශ්‍යතා අභිභවා සිටින බව අවිතරව අවබෝධකර ගෙන ඇති හෙයිණි.

Necessitas publica major est quam private
public necessity is greater than private.

දශක 02කට ආසන්න කාලයක් රනිල් වික්‍රමසිංහයන්ගේ දේශපාලන හා පෞද්ගලික ප්‍රතිරූපය රේල් පිල්ලට තැබූ කාසියක් මෙන් සැලසුම් සහගතව තලා පෙළා දැමූ මුත්, ඉටිපන්දමේ ඉටි දියවී වැක්කෙරුණත් ආලෝකය විහිදුවනවා සේ, ඔහු අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආලෝකවත් කළේය. ප්‍රජාතන්ත්‍රවාදය ජන සමාජයේ ස්ථාවර වීම සඳහා අවශ්‍ය ක්‍රියාදාමය නිරන්තරයෙන් අභ්‍යාස කිරීමට කැපවී කටයුතු කළේය. එක්සත් ජාතික පක්ෂය අත් නොහැර ආරක්ෂාකර ගත්තේය. ඔහුට කෙතරම් අපහාස කළත් පෙරළා

**කිසිවෙකුට අපහාස ද නොකළ අතර නායකයෙකු වශයෙන් තම දේශපාලන ඒෂණියත්වය මොහොතකට හෝ වෙනස් කළේද නැත.**

You will never do anything in this world without courage.
It is the greatest quality of the mind next to honor.
*-Aristotle-*

**ඔබට ධෛර්යයෙන් තොරව මේ ලෝකයේ කිසිවක්**
**කළ නොහැක. ගෞරවයට පාත්‍රවන ශ්‍රේෂ්ට ගුණාංගය එයයි.**

ධම්ම පදයේ ගාථා අංක 02 ගාථාව මෙසේය;-

***'යහපත් සිතින් යුතුව වචන කථාකරන මෙන්ම කයින් ක්‍රියා කරන අය***
***පසු පස ඉවත නොයන සෙවණැල්ල මෙන් සැප ගමන් කෙරේ'***

බුදුන් වහන්සේගේ දේශනා සහ ඉගැන්වීම් වලට අනුව නම් එවැනි දියුණු ධාර්මික සිත් ඇත්තෝ නිර්මල බෞද්ධයෝමැය.

සැබවින්ම ඔහු රජයේ මුදල් වියදම් කරමින් නොයෙකුත් වන්දනාමාන කටයුතු හෝ රට පුරා විවිධ පූජා තබන බෞද්ධයෙකු නොවන අතරම දේශපාලන ක්‍රියාවලියට මොන යම් ආකාරයකින් වත් ආගම ඈදා නොගත් ක්‍රියාවෙන්ම ආදර්ශමත් සැබෑ ආගමානියෝග බෞද්ධයෙකි.

තෙල් තෙල් සමග මිස වෙනත් දෙයක් සමග මිශ්‍ර කළ නොහැකි සේම රනිල් වික්‍රමසිංහයන්ද දේශපාලනය සමග මිස වෙනත් දෙයක් සමග මිශ්‍ර කිරීමට නොහැකිය. එම නිසාම ඔහු ඔබේ දරුවන් හුරතල් කිරීමට කාලය වැය නොකරනු ඇති මුත් ඔහු ඔබේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් රට දියුණු කිරීමට කැප වී ක්‍රියා කරනු ඇත. ඔහු වැඩිහිටියන් සමග ලෙන්ගතු බව පෙන්වීමට රඟනොපාන නමුත් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථික, සාමාජිය සහ සෞඛ්‍ය වටිනාකම් තිරසරව ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.

Hope is the pillar that holds up the world.
Hope is the dream of a waking man.
*- Pliny the Elder -*

**බලාපොරොත්තුව ලෝකය පාලනය කරන කුළුණකි.**
**බලාපොරොත්තුවක් යනු අවදි මිනිසෙකුගේ සිහිනයැයි.**

රනිල් වික්‍රමසිංහයන්ගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ ශ්‍රී ලංකාව ආර්ථික හා සමාජීය වශයෙන් දියුණුවීම හේතුවෙන් රට පුරා පන්සල්, ප්‍රීතියෙන් ජීවත් වන මිනිසුන්ගෙන් පිරි ඉතිරි යනු ඇත.

ඔහු පන්සල්, දන්සල් ආදී ජනයා ඒකරාශී වන ස්ථානවලට පැමිණ ඔබේ කරට අත දැමීමට හෝ බඩට ඇනීමට කාලය නාස්ති නොකරනු ඇත. ඔහු *ආගමික ස්ථාන වලදී නිතරම දැකිය නොහැකි මුත් ඔහුගේ ආණ්ඩුකරණයේදී ආර්ථිකයේ සහ නීතියේ තිබෙන සමාන අවස්ථා නිසා බහුතර සිංහල බෞද්ධයන්ගේ ආර්ථික අධ්‍යාපනික දියුණුව ඇති වනු ඇත.* සැබවින්ම සමානතාව වනාහි සාධාරණතාවම වේ. -Equality is Equity-[15] ආර්ථික හා සමාජීය වශයෙන් රට දියුණුවීම හේතුවෙන් රට පුරා පන්සල් ප්‍රීතියෙන් ජීවත් වන මිනිසුන්ගෙන් පිරි ඉතිරී යනු ඇත. 1950 න් පසුව පළමු වරට බෞද්ධ සිංහල ප්‍රාග්ධනය නැවත ගොඩනැගෙනු ඇත.



රනිල් වික්‍රමසිංහයන් 2001දී ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරය භාරගන්නා අවස්ථාව වන විට නිදහසෙන් පසු ශ්‍රී ලංකාව මුහුණ පෑ දරුණුතම ආර්ථික පරිහානියට ශ්‍රී ලංකාව ඇද වැටී තිබුණි. 2001දී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක එකක් හැර අනෙක් සියල්ල ජයග්‍රහණය කරමින්, එල්.ටී.ටී.ඊ ය සමග සාම සාකච්ඡාවලට එළඹීමේ පදනමක් මත එක්සත් ජාතික පක්ෂය පහසුවෙන් ජයග්‍රහණය කළේය. රනිල් වික්‍රමසිංහයන් අගමැති වූ අතර, චන්ද්‍රිකා කුමාරතුංග සමග සහයෝගිතා ආණ්ඩුවක් පිහිටුවීය. සිය පත්වීමෙන් මාස දෙකකට පසු ඔහු එල්.ටී.ටී.ඊ ය සමග සටන් විරාම ගිවිසුමකට අත්සන් තැබීය. මෙම ගිවිසුමෙන් පසු සාම සාකච්ඡා ආරම්භ විය.

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දැඩි බදු ප්‍රතිපත්ති සහ වෙළඳ පොළ හිතවාදි ප්‍රතිපත්ති අනුගමනය කරමින් විශාල පරිමාණයේ ආයෝජන හා ආර්ථික වර්ධනයක් කෙරේ මඟ පැදීය. ආණ්ඩුව, ආයෝජන මණ්ඩලය, කුඩා සහ ග්‍රාමීය ව්‍යවසායන් පිළිබඳ අමාත්‍යංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වැනි ප්‍රධාන ආර්ථික ආයතන පිහිටුවීය. මෙමගින් 2003 අග වන විට 6%ක තරම් ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට හැකි විය. උද්ධමනය ද 2%ට වඩා අඩු විය. බොහෝ දේශීය හා විදේශීය විශේෂඥයින් අපේක්ෂා කළේ ශ්‍රී ලංකාව තවත් වසර කීපයක් ඇතුළත දී ඉලක්කම් දෙකක විශාල ආර්ථික වර්ධනයක් හිමිකර ගනු ඇති බවයි. නමුත් ව්‍යාජ දේශමාමක බලවතුන් උක්ත දියුණුව විනාශ කර දමන ලද්දේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයෙන් පහකොට දැමීමෙනි.

රනිල්

# අධ්‍යාපන සංවර්ධනයේ පුෂ්පය මෙන්ම බීජයද වන්නේය

ජේ.ආර්. ජයවර්ධන ජනාධිපති තුමා යටතේ අධ්‍යාපන අමාත්‍ය ධූරය අති සාර්ථකව ක්‍රියාත්මක කර, ශ්‍රී ලංකාවේ බහුතර ජනයාගේ දූ දරුවන්ට ඉහළ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට සහ ඊට සමගාමීව ඉංග්‍රීසි භාෂාව, විද්‍යා විෂයන් හා ගණිතය ඉගැන්වීමට අවශ්‍ය අධ්‍යාපනික පහසුකම් වැඩි දියුණු කිරීම එතුමාගේ දේශපාලන ජීවිතයට එල්ල වූ මරු පහරක් බවට පත් වී ඇත.

බහුතර ජනයාගේ දූ දරුවන්ගේ දැනුම දියුණු වීමෙන් තව දුරටත් අවස්ථාවාදී දේශපාලනයේ යෙදීමට තමන්ට හා තම පක්ෂවලට නොහැකි වන බව දැනගත් බොහෝ පිරිස් 1977න් පසුව ශ්‍රී ලාංකික මහා සමාජය පුරා එතුමන්ට එරෙහිව ඉතා බලවත් අපහාස, උපහාස ජනිත කරවන ලදී.

එක්සත් ජාතික පක්ෂයට විරුද්ධ දේශපාලන පක්ෂ මෙන්ම ජනාධිපති බලතල සහිත ආණ්ඩු 02ක් දීර්ඝකාලීනව දිනපතා උදේ, දිවා, රාත්‍රී පුරා වසර 20 කට වැඩි කාලයක් එතුමන්ට එරෙහිව ආගමික හා ජාතික මූවාවෙන් මඩ ප්‍රචාරය ගෙන යන ලදී.

උක්ත ක්‍රියාවේ යෙදුන අති බහුතර පුද්ගලයන්ගේ දූ දරුවන් පමණක් නොව මුණුපුරන්ද ලෝකයේ බලවත් විශ්ව විද්‍යාලවල ඉංග්‍රීසි භාෂාවෙන් උසස් අධ්‍යාපනය හදාරත්දී තමන් උපන් රටේ බහුතර ජනයාට ගෝලීය දැනුම ලබා දීමට අවංකව කටයුතු කරන ලද රනිල් වික්‍රමසිංහයන් දේශ ප්‍රේමියෙකු නොවන බව ජන ගත කිරීමට නිරන්තරයෙන් ඔවුන් උත්සාහ කරන ලදී.

2015 සිට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය වශයෙන් ඔහු කටයුතු කරත්දී පවා අදටත් උක්ත උත්සාහය නොනැවති ක්‍රියාත්මකය. එහෙත් ඔහු එම ක්‍රියා වැලක්වීම සඳහා

මොහොතක් හෝ වැය නොකට තම කාලය, දැනුම ශ්‍රී ලංකාවේ අනාගතය වෙනුවෙන් කැප කරමින් නොනැවති ක්‍රියාත්මකය.

1931 දී අධ්‍යාපන ඇමැති පදවියට පත් වූ සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිදුන් 1947 ඉන්දියාවේ කල්කටා හී පැවත්වුණ ජගත් සංස්කෘතික සම්මේලනයේ මුලසුන ගනිමින් මෙසේ ප්‍රකාශ කර ඇත. මගේ රටේ සමාජ හෝ ආර්ථික තත්ත්වය, ජාතිය, කුලය හෝ ආගම යන කිසිවක් නොතකා ගැහැණු හා පිරිමි ළමයින්ට බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා ඉගැන්වීමට එරෙහිව, මගේ රටේ විශාල සහ බලවත් පිරිසක් දිගින් දිගටම ඉතා උග්‍ර විරෝධතා, නිග්‍රහ කිරීම් සහ සමච්චල් කරන ලද්දේ බහුතර ජනයාගේ දූ දරුවන්ට අධ්‍යාපනය දීම වළක්වාලීම සඳහාය. එම විරෝධතා සියල්ල යටපත් කොට ලංකාවේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා සමත් විය. ඒ අනුවත් පැහැදිළි වනුයේ, හෙළිදරව් වනුයේ රනිල් වික්‍රමසිංහයන්ට දක්වන විරෝධයට සැබෑ හේතුව බහුතරය දියුණු කිරීමට ඔහු දරන අවංක උත්සාහය බවයි.

නමුත් රනිල් වික්‍රමසිංහයන් කෙතරම් ජන හිතකාමී ජනප්‍රිය දේශපාලනඥයෙකු ද යන්නට හොඳම උදාහරණය වනුයේ ඔහුගේ 40 වසරක දේශපාලන චාරිකාව ඇතුළත තමන් ඉදිරිපත් වූ සෑම මැතිවරණයකදීම ඊට පෙර මුහුණ දුන් මැතිවරණයට වඩා පිළිවෙලින් වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීමයි. ශ්‍රී ලාංකික මැතිවරණ ඉතිහාසයේ පාර්ලිමේන්තු මැතිවරණයක දී මෙතෙක් ලබාගත් වැඩිම මනාප ඡන්ද සංඛ්‍යාව වසර 2015දී ලබා ගත්තේද රනිල් වික්‍රමසිංහයන්ය. 2015 ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණය නියමිත කාලයට මාස දහයකට පෙර 2015 අගෝස්තු මස 17 වන දින ශ්‍රී ලංකාවේ 15 වන පර්ලිමේන්තුවේ සාමාජිකයින් 225 දෙනා තෝරා පත් කරගැනීම සඳහා පවත්වනු ලැබිණි.

රනිල් වික්‍රමසිංහයන් බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයට තරග කරමින් ඡන්ද 500,566 ක් ලබා ගත්තේ ජාතිය, ආගම හෝ කුලය පිළිබඳ ජන මනසට අල්ලස් දීමෙන් නොවන බව දේශීයව මෙන්ම ජාත්‍යන්තරව පවා මහත් ඇගයීමට හා සාකච්ඡාවට ලක් වූ කාරණයකි. එමෙන්ම අහස උසට නිර්මාණය කළ කටවුට් හා බැනර් පෝස්ටර් පාර පුරා ප්‍රදර්ශනය කළේද නැත. අනෙක් අතට වඩාත් තීව්‍ර තර්ජනයට ලක් කර තිබූ සර්ව ජන ඡන්දයට

එරෙහි භීෂණය ජන සමාජයෙන් බැහැර වීමට එතුමාගේ අවිහිංසාවාදී නිර්භීත දේශපාලන නායකත්වය මහත් පූර්වාදර්ශයක් විය.

සර්ව ජන ඡන්දය සංස්කෘතියක් හා වගකීමක් නොමැති ධනපතියන්ගේ උපකරණයක් බවට පරිවර්තනය කොටගෙන තිබුනේ 'නීතියේ ආධිපත්‍යය, භීතියේ ආධිපත්‍යය' බවට හරවා දේශපාලන ප්‍රචන්ඩත්වය ශ්‍රී ලාංකික ජනසමාජය පුරා පැතිර වීමෙනි. 2005 වසරින් පසුව 2015 ජනවාරි 08 වැනිදා දක්වා පැවත්වූ සෑම මැතිවරණකම පොදු ලක්ෂණය වූයේ රාජ්‍ය ප්‍රචණ්ඩත්වයයි. එකල රාජ්‍ය හා දේශපාලන ප්‍රචණ්ඩත්වය යනු රාජ්‍ය පාලන චාරිත්‍රයක් බවට පත් වී තිබුණි. සැබවින්ම සර්ව ජන ඡන්දය සංස්කෘතියක් හා වගකීමක් නොමැති බලවතුන්ගේ අනාගතය ස්ථිර කරන සමාජ උපකරණයක් බව 2005 න් පසුව පැවැත්වූ මැතිවරණ ගණනාවක දීම ඉතා හොඳින් දර්ශනය විය.

නමුත් රනිල් වික්‍රමසිංහයන්ගේ උක්ත මැතිවරණ ජයග්‍රහණය, සංස්කෘතියක් හා වගකීමක් නොමැති ධනපතියන්ගේ ධනය සහ බලයට අමතරව රාජ්‍ය හා දේශපාලන ප්‍රචණ්ඩත්වය අභිබවා එතුමාගේ දේශපාලන භාවිතය හා අවංක භාවය ජන සමාජයේ අළු යට ගිණිමෙන් ස්ථිරව සනිටුහන් වී තිබී ඇති බවට කදිම උදාහරණයකී.

# ඔබ දන්නවාද?

ශ්‍රී ලාංකිකයන්ගේ දේශපාලන සාක්ෂරතාවය ඉහළ තලයක නොතිබුනත් රනිල් වික්‍රමසිංහයන්ගේ ආර්ථික සමාජ දර්ශනය පිළිබඳව ජනයාට ඉතා ඉහළ පිළිගැනීමක් තිබී ඇති බව උක්ත මැතිවරණ ප්‍රතිපල අනුව ස්ථිරය. ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ කිසිම දේශපාලනඥයෙකුට මුහුණ දී ජයගත නොහැකි අති විශාල දේශපාලන මඩ ගැසීම් හා අපවාද සිය දහස් ගණනකට, පෙරළා අපවාද, අපහාස ඇතුළු අවභාෂණය නොකළ ඔහු, කිසිම පුද්ගලයෙකුගේ පුද්ගලික චරිතයට අපහාස කිරීමට එකදු වචනයක් හෝ භාවිතා නොකිරීම අමතක නොකළ යුතු ඉතා තීරණාත්මක දේශපාලන කාරණයකි.

සත්‍ය වශයෙන්ම රනිල් වික්‍රමසිංහයන් ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතියට මහා ආදර්ශයක් මෙන්ම බලවත් පුරුෂෝත්තම සජීවී දේශපාලන සමාජීය චාරිත්‍රයකි. ඔහු ජාතිවාදය හෝ ආගමික කරුණු මෙන්ම දූප්පත්කම, වැනි කාරණා මතින් සමාජ හා දේශපාලන ගැටලු ජය ගැනීමට ක්‍රියා නොකළ ශක්තිමත් ශ්‍රී ලාංකික සිංහල බෞද්ධ ජනතා පුත්‍රයෙකි. සැබවින්ම ඔහු මනා වූ හා යෝග්‍ය වූ හා ප්‍රභාවිත මෙන්ම මනා ප්‍රතිෂ්ඨාව සහිත අව්‍යාජ ප්‍රශංසිත නායකයෙකි.

True leaders are like statues, whether it rains or it shines,
they never bend their necks to look backwards!
They never run away from challenges!
**සැබෑ නායකයන් පිළිම හා සමානය. වැස්සත් පැව්වත්**
**ඔවුන් බෙල්ල හරවා ආපසු හැරී බලන්නේ නැත.**
**සැබෑ නායකයන් අභියෝග හමුවේ පලා යන්නේ නැත.**

රනිල් වික්‍රමසිංහ යනු ගෝලීයකරණය හා රටේ භූ විද්‍යාමය ලක්ෂණයන්ගෙන් නිර්ණය වන දේශපාලනය, පාරිසරික සුරක්ෂණය, ප්‍රබුද්ධ රාජ්‍යකරණය, තිරසර ආර්ථික සංවර්ධනය, ජනගහන වර්ධනය හා මානව සම්පත් සංවර්ධනය, ප්‍රජා විද්‍යාත්මක රටාව හා අධ්‍යාපනයේ නවීනතම වෙනස්වීම්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නවීනතම ප්‍රසාරණය, නවෝත්පාදක කෘෂිකර්මාන්තය, කෘෂිකාර්මික පරිසරය සහ නිෂ්පාදන සඳහා ද්‍රව්‍ය හා සත්ව විද්‍යාව,කෘෂිකාර්මික ක්ෂේත්‍ර යන්ත්‍රෝපකරණ, ගොවිපොළ උපකරණ යාන්ත්‍රණය, කෘෂි නිෂ්පාදන

බෙදාහැරීම, කෘෂි නිෂ්පාදන වෙළෙදාම සහ කළමනාකරණය, ගොවිපොල උපකරණ යාන්ත්‍රණය, අන්තර්ජාතික වෙළෙදාම, ධීවර සහ සමුද්‍ර පරිවහනය, සාගර විද්‍යාව සහ කාලගුණ විද්‍යාව, නවීනතම ගොඩබිම් ප්‍රවාහන සැලසුම්, නැවත ඇති වන සහ ඇති නොවන ස්වභාවික සම්පත් හා සාගර සම්පත් ඇතුළු සාගර ආර්ථිකය හා පරිගණක ක්ෂේත්‍රයේ හා ඒ හා බැඳුණු තොරතුරු තාක්ෂණය මෙන්ම ඉංජිනේරු විද්‍යාවේ නවීන ක්‍රම සැලසුම් පිළිබඳව මෙන්ම ජනගහන වර්ධනයට අනුව නගර හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනයට අදාල නවීන විද්‍යා තක්ෂණික දැනුමෙන් සපිරි පළල් අවබෝධයක් ඇති වෘත්තීයමය දේශපාලනයේ නියුතු ආදර්ශමත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යතාන්ත්‍රිකයෙකි.

ඊට කදිම උදාහරණයක් වශයෙන් එතුමන් කර්මාන්ත ඇමතිවරයා වශයෙන් කටයුතු කළ අවස්ථාවේ ජපාන රජයත් සමග මෙගොලෝපොලිස් ක්‍රමයට අනුව බස්නාහිර පළාත සංවර්ධනය කිරීම සඳහා සාකච්ඡා කර තිබීම දැක්විය හැකිය. ඒ අදට වසර 25 කට පමණ පෙරදීය.  යළි පුබුදමු ශ්‍රී ලංකා යෝජනා වලියේද බොහෝ දියුණු ව්‍යාපෘති ඇතුළත් වී තිබුණේ එතුමාගේ දැක්මට අනුවය. රනිල් වික්‍රමසිංහයන්  නායකත්වය සහ ඉගෙනීම යන සුදුසුකම් වලින් පිරිණු  දේශපාලනඥයෙකි. සැබවින්ම නායකත්වය සහ ඉගෙනීම යනු එකිනෙකට අත්‍යවශ්‍යය කරුණු දෙකක් වන අතර එවැනි නායකයන් බිහිවන රටවල් වාසනාවන්ත, දියුණු රටවල් බවට පත් වනුයේ ඡන්ද දායකයින්ගේ දේශපාලන දැනුම මතය. නමුත් ශ්‍රී ලංකාවේ දේශපාලන නූගත්කම -Political illiterate- ඉතා ඉහළ අගයක් දක්වා වර්ධනය වී ඇත. දේශපාලන නූගත්කම අවම කිරීම සඳහා කටයුතු කිරීමද අත්‍යවශ්‍යය කාරණයක් බවට පත් වී ඇත.

දේශප්‍රිය නානායක්කාර

# ශ්‍රී ලාංකික දේශපාලනයේ නියුතු බලවත්ම ගෝලීය රාජ්‍යතාන්ත්‍රිකයා

ඉහත සඳහන් කර ඇති පරිදි රනිල් වික්‍රමසිංහ යනු අධ්‍යාපන සංවර්ධනයේ සහ තිරසර ආර්ථික සංවර්ධනය හා පාරිසරික සුරක්ෂණය පිළිබඳව නූතන විද්‍යා හා තාක්ෂණික දැනුම ඇති පූර්ණකාලීනව වෘත්තීමය දේශපාලනයේ නිරත වන ආසියාවේ ප්‍රවීණතම විශිෂ්ටයාය.

True leaders don't give consoling answers,
they take constructive actions
සැබෑ නායකයන් සැනසීමට කරුණු නොකියන
නමුත් ඔවුහු ඵලදායි ක්‍රියාවන් කරති.

ජාත්‍යාන්තරව අවංක ශීලාචාර ප්‍රජාතන්ත්‍රවාදියෙකු වශයෙන් ප්‍රචලිත රනිල් වික්‍රමසිංහයන් ජාත්‍යන්තර ප්‍රජාතාන්ත්‍රික සංගමයේ කීර්තිමත් සමාජිකයෙකු වන අතර එතුමන් එම සංගමයේ උප සභාපති ධුරයේද කටයුතු කර ඇත. ජාත්‍යන්තර ප්‍රජාතාන්ත්‍රික සංගමය (IDU) යනු කේන්ද්‍රීය දක්ෂිණාංශික දේශපාලන පක්ෂවල ගෝලීය සන්ධානයකි. ජර්මනියේ මියුනිච් හි මූලස්ථානය පිහිටා ඇති විවිධ රටවල් 63කින් පූර්ණ සහ නියෝජිත සාමාජික රටවල් 71කින් උක්ත සංවිධානය සමන්විතය. ඒ අනුවත් පැහැදිළි වනුයේ රනිල් වික්‍රමසිංහයන් සතු ගෝලීය දේශපාලන සබඳතා සහ ආර්ථික, සමාජ දියුණුව පිළිබඳව නවීනතම දැනුම ඔහු උපයාගෙන ඇති ආකාරයයි.

ශ්‍රී ලංකාව කුඩා දිවයින් රාජ්‍යයක් වුවත් ලෝකයේ බලවත්ම රාජ්‍ය නායකයන් සමග ගෝලීයකරණය, සාගර හා අභ්‍යවකාශ සම්පත්, ආර්ථික සංවර්ධනය, මානව අයිතිවාසිකම්, මානව සංවර්ධනය, නවීන අධ්‍යාපනය, නවීන තක්ෂණය හා රාජ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ නවීන දැනුමෙන් යුතුව කටයුතු කිරිමට රනිල් වික්‍රමසිංහයන්ගේ උත්සාහය නියත වශයෙන් සාර්ථක වනු ඇත්තේ මෙම කෘතිය පුරා විස්තර කෙරෙන දැනුම ඔහු සතුව ඇති හෙයිනි.

ආසියා පැසිෆික් ඩිමොක්‍රටික් සංගමය (APDU) යනු ජාත්‍යන්තර ප්‍රජාතාන්ත්‍රික සංගමයට ආසන්න සාමාජික සාමාජිකාවන්ගේ යුක්ත ජාත්‍යන්තර සංගමයකි. ආසියා පැසිෆික් ඩිමොක්‍රටික් සංගමයේ වර්තමාන සභාපති ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාය. ඕස්ට්‍රේලියාව, කැනඩාව, මහජන චීන තායිවානය, චිලි රාජ්‍යය, එල්සැල්වදෝර් රාජ්‍යය, ඉන්දියාව, ඉන්දුනීසියාව, දකුණු කොරියාව, මාලදිවයින, මොන්ගෝලියාව, නේපාලය, නවසීලන්තය, ඇමරිකාව යන රටවල දේශපාලන පක්ෂ උක්ත සංගමයේ සාමාජිකත්වය දරයි. 2005 වසරේ දී ආසියා ෆැසිෆික් ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ සභාපති ලෙස රනිල් වික්‍රමසිංහයන් ඒකමතිකව තෝරාගැනීම ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවට මහත් කීර්තියක් විය. ඊට සමගාමීව රනිල් වික්‍රමසිංහයන් ද නැවත නැවත ජාත්‍යන්තර ගෞරවයට පාත්‍රවූයේ ශ්‍රී ලංකාවට බලවත් අභිමානයක් සහ ගෞරවයක්ද හිමිකර දෙමිනි. එමෙන්ම ආසියාව, යුරෝපය, ඇමරිකාව ප්‍රධාන මහද්වීප 05 ම බලයේ සිටින සහ විරුද්ධ පක්ෂයේ සිටින වැඩිමනත් දේශපාලනඥයන් සහ රාජ්‍ය නිලධාරීන් සමග සමීප සබඳතා ඇති ජනප්‍රියම ශ්‍රී ලාංකික දේශපාලනඥයා ඔහු බවද අවිවාදිතය.

Lead and develop true leaders; that is true leadership!
මෙහෙයවීම සහ සංවර්ධනය යනු සැබෑ නායකත්වය යයි.

අද්‍යතන ව ලෝකයේ ඕනෑම රටක් තම ආර්ථික දියුණුව වර්ධනය කර ගත යුත්තේ ජාත්‍යනතර ආර්ථික සම්බන්ධතාවයන් International Economic Relations[16] අනුවය. අද්‍යතන ලෝකයේ රටක් දියුණුව කරා මෙහෙයවීමේදී ඉතාමත් තීරණාත්මක වී ඇත්තේ ගෝලීය ආර්ථික නීතියයි, International economic law,[17] ගෝලීය ආර්ථික සම්බන්ධතාවයන් ප්‍රවර්ධනයට හා පාලනයට නතු කරන නීතිය අතිශය වැදගත් ක්ෂේත්‍රයකි. මෙම ක්ෂේත්‍රය ඇතුළත ගෝලීය නීති රෙගුලාසි හා මූලධර්මයන් සහ ජාත්‍යන්තර ආයතනයන් රාශියක් ක්‍රියාත්මකය. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝකයේ දක්නට ලැබෙන ආර්ථික අන්‍යෝන්‍ය යැපුම් මට්ටමේ වර්ධනය ඒ අනුව ඉතා පැහැදිළිව දර්ශනයවේ. ජාත්‍යන්තර ආර්ථික නීතිය අතිශය පාථුල විෂයකි. ආර්ථිකය හා සම්බන්ධ බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතිය The Bretton Woods system[18] හා ගෝලීය ආර්ථික සංවිධාන වල, International economic organizations[19] ක්‍රියාකාරීත්වය මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල The International Monetary Fund[20], ලෝක බැංකුව The World Bank[21], තීරු බදු සහ වෙළෙඳ ගිවිසුම් පිළිබඳ පොදු එකඟතා, ලෝක වෙළෙඳ සංවිධානය The World Trade Organization[22], භාණ්ඩ පිළිබඳ


වෙළෙද ගිවිසුම් Commodity agreements[23] පිළිබඳ දැනුමක් ඇති නායකයෙක් යනු රටක අනාගතයට ඉතා වටිනා මිනිසෙක් බව මේ අනුව ඉතා පැහැදිළි වනු ඇත.

අනෙක් අතට සේවා පිළිබඳ පොදු එකගතාවයන් the international regulation of services (GATS)[24], බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ ගිවිසුම් The Agreement on Trade Related Aspects of Intellectual Property Rights (TRIPS)[25] හා ආයතනික විධිවිධාන පිළිබඳව සහ නව ගෝලීය ආර්ථික රටාවක් සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් නීතියේ පිහිට පැතීම The New International Economic Order (NIEO)[26] ඇතුළුව අපසර්ජනය හා වන්දි නිශ්චය කිරීමේ මූලධර්ම, සැගවුණු අපසර්ජන මූලධර්ම, ගිවිසුම්ගත අයිතිවාසිකම් අපසර්ජනය කිරීම මෙන්ම සංවර්ධනය සඳහා ඇති අයිතිවාසිකම් ඉන් ප්‍රධානය. විදේශ ආයෝජන නීතිය, ආර්ථික සබදතා පිළිබඳ නීතිය, ආර්ථික ආයතන පිළිබඳ නීතිය, ප්‍රාදේශිය ආර්ථික හවුල් පිළිබඳ නීතිය, දේශභූමි-බාහ්‍ය බලපෑම්, රාජ්‍ය නිර්මුක්තිය, බහුජාතික ව්‍යාපාරවල කාර්යභාරය, ගුවන් ප්‍රවාහනය, විදුලි සංදේශ ගනදෙනු, පරිසරය ආරක්ෂා කිරීම හා රාජ්‍ය දූත ආරක්ෂාව, ප්‍රබුද්ධ රාජ්‍ය කරණය ආදී ජාත්‍යන්තර ආර්ථික සම්බන්ධතා පිළිබඳ නීති ක්ෂේත්‍ර පිළිබඳව මනා දැනුමක් රටක් දියුණු කිරීමට අත්‍යවශ්‍යය.

රනිල් වික්‍රමසිංහ දේශපාලන දැනුමෙන්ද, ආර්ථික දැනුමෙන්ද, ගෝලීය දැනුමෙන්ද, බුදු දහමෙන්ද තම සිතුවිලි වලට පන්නරය ලබාදෙන ගිනියම් වූ විට සිසිල් වන බලවත් නායකයෙකි. වානේ පන්නරය ලබන්නේ ගිනියම් වීමෙන්, සිසිල් විය යුතු වූ විට සිසිල් වීමෙන්, පමණක් නොව තැලීම් පෙළීම් ආදී සියල්ලන්ගෙන්මය. ගිනියම් වී ඇති අපේ ශ්‍රී ලංකාව සිසිලෙන් සිසිලට පත්කළ හැක්කේ වර්මානයෙන් ඔබ්බට අවධානය යොමු කොට අනාගතයට අවශ්‍ය ආකාරයට කටයුතු කිරීමෙනි. ජීවිතයක නැණවත් බව හෙළිදරව් වනුයේ පොදු යහපත වෙනුවෙන් වෙහෙස වී කටයුතු කරන ආකාරයෙනි. රනිල් වික්‍රමසිංහයන්ගේ වසර 40 දේශපාලන ජීවිතයේදි ඔහුගේ ජීවිතය අභ්‍යාස කර ඇත්තේ ජන සමාජයේ අවශ්‍යතා වෙනුවෙන් නැණවත් ආකාරයෙනි. සැබවින්ම ශ්‍රේෂ්ඨයන්ගේ උදාර අරමුණු ගොඩනැගෙන්නේ ඔවුන් වටා හැසිරෙන සිතුවිලි වලිනි. ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ට අධිෂ්ඨාන ඇත. දුබලයන්ට ඇත්තේ ප්‍රාර්ථනා පමණි.

සැතපුම් දස දහස් ගණනක ගමනක් ආරම්භ වනුයේ එක් පියවරකිනි. ශ්‍රී ලංකාවට අවශ්‍ය වන්නේ බහුතර බලය ඇති එක්සත් ජාතික පක්ෂයේ

ආණ්ඩුවකි. එවිට රනිල් වික්‍රමසිංහයන්ගේ දැනුම හා අත්දැකීම් ශ්‍රී ලාංකික ජන සමාජයේ අභ්‍යාස වනු ඇත්තේ බහුතර ජනයාගේ ජීවිත දියුණු වීම සඳහා අවශ්‍ය ඒක පුද්ගල ආදායම ඉහළට ඔසවා තබමින් ඔවුන්ගේ දූ දරුවන් ලෝක දැනුම් ආර්ථිකයට අවශ්‍ය ආකාරයට සූදානම් කිරීමෙනි. සැබවින්ම බහුතර බලය යනු රටක් වෙනස් කිරීමට අත්‍යවශ්‍යම කාරණයෙකි. එක්සත් ජාතික පක්ෂයේ දෘෂ්ටිවාදය පිළිගන්නා බහුතර ජනයාගේ පරම යුතුකම වන්නේ සියලු ආසන සංවිධායකයන් පාර්ලිමේන්තුවට තෝරා පත්කර එවීමට කටයුතු කිරීමයි. එවිට රනිල් වික්‍රමසිංහයන් තම දැනුමෙන් ශ්‍රී ලංකාව දියුණුවෙන් දියුණුවට පත්කර බලගතු ශ්‍රී ලංකාවක් බිහි කරනු ඇත්තේ ස්ථිරවමය. සැබවින්ම රනිල් වික්‍රමසිංහයන් ශ්‍රී ලංකාවේ ස්ථිර අනාගතය වෙනුවෙනි. එක් රටකට පමණක් සීමා කළ නොහැකි එහෙත් සමස්ත මානව සංහතියටම පොදු යහපත් පණිවුඩයක් සැබෑ විශිෂ්ටයන් සතුව ඇත.



මිනිසාට සේවය කිරීමට හා නායකත්වය දීමට
ඉදිරිපත් වූ පුද්ගලයන්ගේ ක්‍රියා කලාපය
ලෝකය පටන් ගත් දා පටන්ම හෙළා දැක ඇත්තේය.

-මහත්මා ගාන්ධි-



නරක මිනිසුන් නිසා හැම විටම හොඳ මිනිස්සු
දුක් විඳිති. තාඩන පීඩනවලට ගොදුරු වෙති.
හොඳ මිනිසුන්ට වඩා නරක මිනිසුන් තමන් දක්ෂයෝ
යැයි ඔප්පු කිරීමට නොකරන දෙයක් නැත.
නරක මිනිස්සු ඉක්මනට දියුණු වෙති.
එහෙත් අන්තිමේදී හැමවිටම බලාපොරොත්තු
නොවූ දෙයක් සිදු වී නරක මිනිස්සු පරදති.
හොඳ මිනිස්සු ජය ගනිති.

-මැක්සිම් ගෝර්කි-

01. https://en.wikipedia.org/wiki/Ape
02. https://en.wikipedia.org/wiki/Homo_sapiens
03. https://en.wikipedia.org/wiki/Socrates
04. https://en.wikipedia.org/wiki/Lebensphilosophie
05. The British Constitution – Ivor W. Jennings Ch.1 –p 56,
06. https://en.wikipedia.org/wiki/Political_literacy
07. https://en.wikipedia.org/wiki/Charles_I_of_England
08. https://en.wikipedia.org/wiki/James_II_of_England
09. https://en.wikipedia.org/wiki/Frederic_Austin_Ogg
10. The British Constitution – Ivor W. Jennings Ch.2 –p 32
11. Strategy of Freedom – Harold J.Laski.p 121'
12 .https://www.crcpress.com/The-Strategy-of-Freedom-Works-of-Harold-J-Laski-An-Open-Letter-to-Students/Laski/p/book/9781138823075#googlePreviewContainer
13. The Republic : p,102
14. Knowledge is power – Sir, Francis Bacon
15. www.oxfordreference.com/view/10.1093/oi/authority.20110803095755518
16. https://ebrary.net/.../economics/international_economic_relations_system_world_econ.
17. https://en.wikipedia.org/wiki/International_economic_law
18. https://en.wikipedia.org/wiki/Bretton_Woods_system
19. https://en.wikipedia.org/wiki/Category:International_economic_organizations
20. IMF -- International Monetary Fund Home Page www.imf.org/
World Bank Group - International Development, Poverty, & Sustainability
21. https://www.worldbank.org/
https://www.youtube.com/WorldBank
https://en.wikipedia.org/wiki/World_Bank_Group
List of International Trade Agreements: Tariff and Tax in International ...
https://scm.ncsu.edu/.../list-of-international-trade-agreements-tariff-and-tax-in-internat

22. https://en.wikipedia.org/wiki/World_Trade_Organization
https://www.wto.org/
23. https://en.wikipedia.org/wiki/International_commodity_agreement
24. WTO | Services - The GATS: objectives, coverage and disciplines
https://www.wto.org/english/tratop_e/serv_e/gatsqa_e.htm
25. https://en.wikipedia.org/wiki/TRIPS_Agreement
26. https://en.wikipedia.org/wiki/New_International_Economic_Order

## ප්‍රණාමය!

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අමාත්‍යය රාජිත සේනාරත්න
රවී කරුනානායක
අකිල විරාජ් කාරියවසම්
නවීන් දිසානායක
කබීර් හෂීම්
මංගල සමරවීර
සාගල රත්නායක
රුවන් විජේවර්ධන
ගයන්ත කරුණාතිලක
නිරෝෂන් පෙරේරා
යන මහත්වරුන්ට
සහ
ලක්ෂ්මන් නානායක්කාර
චමින්ද තල්ගස්වත්ත
උපුලී රණවීර
කස්තුරි අනුරාධනායක
බන්දුල ගුරුසිංහ
හර්ෂ වීරකෝන්
අජිත් කෝණාර
පාලිත විජේසිංහ
මංජුල පතිරණ
සමන් දිසානායක
චාමර ප්‍රසන්න කොඩිතුවක්කු
සංජය ඇපා සෙනෙවිරත්නට

REFERENCE

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

''අක්ෂර දෝෂ සහිත පිටු''

පූර්විකාව 2019.03 .10

14 පිටුව අවසන් ජේදයේ අවසන් පේළියේ **ඇති**
**කරනු ලබයි.**

15 වන පිටුවේ දෙවන ජේදයේ 4 වන පේළියේ
**හැඟිමෙන්**

16 පිටුවේ **'Abraham Thomas Lincoln'**

17 වන පිටුවේ 6 වන පේළියේ **ආකාරයක**

18 පිටුවේ **Cannot**

21 වන පිටුවේ 8 වන පේළියේ **18 ඉක්මවූ**

22 වන පිටුවේ දෙවන ජේදයේ 06 පේළියේ
**හෙයිනි**

32 වන පිටුවේ දෙවන ජේදයේ **කුශාග්‍ර**

38 වන පිටුවේ 07. **සකස්කඩ යතු උක්ත පත්ස**
**පොත් හතය** සහ අවසන් ජේදයේ අවසන්
පේළියේ **බැඳුණු** වශයෙන් නිවැරදි විය යුතු

# ප්‍රජාතාන්ත්‍රික ජීවන ක්‍රමය සහ රනිල්ගේ දේශපාලන නායකත්වය

*-Man is by nature a political animal-*

මිනිසා ස්වභාවයෙන්ම දේශපාලන සත්වයෙකු බව ඇරිස්ටෝටල් ප්‍රකාශ කර ඇති බව අප දන්නා කාරණයකි. එ නමුත් ලෝකයේ බොහෝ රටවල මැතිවරණ දිනා ගන්නා ජනප්‍රිය එහෙත් ප්‍රජාතාන්ත්‍රික ජීවන ක්‍රමය පිළිබඳ අවබෝධයක් නොමැති පුද්ගලයන් ඒ ඒ රටවල අනාගතය කඩාකප්පල් කර ඇත්තේ පොදු ජනසමාජයේ දේශපාලන සාක්ෂරතාවය ජාති හා ආගමික අන්තවාදයේ ගිල්වාලීමෙනි. විශේෂයෙන් ම දුෂ්කර ආර්ථික හා දේශපාලන තත්ත්වයන් මධ්‍යයේ, ඔවුන්ගේ බලය තහවුරු කරගැනීම සඳහා මෙවැනි නායකයන් විසින් ජාතිවාදය වඩ වඩාත් භාවිතා කරනුයේ මහා ජන සමාජය රැවටීම සඳහාය මෙවැනි අවස්ථාවලදී සැබෑ දේශපාලන පක්ෂ ක්‍රියා කළ යුත්තේ සත්‍යය ගරුකොට ගෙනය. ඇත්ත වශයෙන්ම රටක වත්මන් පරපුර පමණක් නොව අනාගත පරපුර පිළිබඳවද තිරසර දැක්මක් ඇති නායකයන්ගේ පළමු යුතුකම සහ වගකීම වනුයේ රටේ අනාගතය වෙනුවෙන් සත්‍යය ප්‍රකාශ කිරීමය. සත්‍යය කතා කිරීම ඕනෑම රටක අනාගතයට බලපාන බලවත්ම පක්ෂපාතීත්වයකි.

අනෙක් අතට තමන් නායකත්වය දෙන රටේ ජන සමාජය ප්‍රජාතාන්ත්‍රික ජීවන ක්‍රමයට හුරුකිරීම සඳහා ආදර්ශමත්ව දේශපාලනයේ නියුතු වීමද ඉතා වැදගත් දේශපාලන ක්‍රියාවකි. ඒ අනුව ප්‍රජාතාන්ත්‍රික ජීවන ක්‍රමය පිළිබඳව සහ එක්සත් ජාතික පක්ෂයේ නායක ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහයන් පිළිබඳ රචිත රනිල් ලියවිල්ල කාලෝචිතය. මක්නිසාද යත්, ශ්‍රී ලංකාව පසු කරන ලද දේශපාලන සංස්කෘතිය වූයේ දේශපාලන බියවැද්දීම් සහ තර්ජනයෙන් පොළඹවා ගැනීම්, භීෂණයෙන් සපිරි පක්ෂ සංග්‍රහය සමඟ එකට පෙළගැසුණු ව්‍යාජ දේශමාමකත්වය හා මිශ්‍ර වූ භීතියට පත් වූ ජන සමාජයකි. ඕනෑම ජනසමාජයක පීඩනය සහ ආඥාදායකත්වය සක්‍රියව ඇති විටදී කථා නොකරමින්ම රට වාසීහු තම තමන්ගේ ආත්ම ගෞරවය අහිමි කර ගනී. සැබවින්ම ජන සමාජය නොහොත් ප්‍රජාව පාලනය සඳහා ක්‍රියාත්මක කළ හැකි දුෂ්ටතම දේශපාලන ක්‍රමය උක්ත ක්‍රමයයි. ඒ අනුව තෝරා බේරා කල්පනා කළ යුත්තේ ප්‍රජාතාන්ත්‍රිය පාලන ක්‍රමයක් යනු සියලු දෙනාගේ ජයග්‍රහණයක් බවයි.

වෛද්‍ය රාජිත සේනාරත්න
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
සෞඛ්‍යය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යය සහ
ලෝක සෞඛ්‍යය සංවිධානයේ උප සභාපති
2019 මාර්තු 15 දි ය.